

# රණවිරුවා

2021 දෙසැම්බර් • 237 කලාපය





## උපන් බිම සුරකින පුතුන්ගේ සම්ප්‍රාප්තිය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# උපන් බිම සුරකින පුතුන්ගේ සම්ප්‍රාප්තිය



දෙස සුරැකීමේ අභීත මෙහෙවරට කැපවූ කෙඩෙට් නිලධාරීන් 316 දෙනකුගේ විසිරයාමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් 19 වන දින දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පැවැත්විණ. ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ආරාධනයෙන්, එම අභිමානවත් අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමා සහභාගී විය.

ජාතියේ ආරක්‍ෂකයන් ලෙස කැපව විසිර ගිය එම පිරිසට නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 89, 89බී, 90, ස්වේච්ඡා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 60 සහ ස්වේච්ඡා කෙඩෙට් නිලධාරිනී පාඨමාලා අංක 17 ට අයත් පිරිස ඇතුළත් වූහ. ජනාධිපති ආර්යාව අයෝමා රාජපක්ෂ මැතිනිය, ආරක්‍ෂක ලේකම් මේජර් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ සභාපතිනි චිත්‍රානි ගුණරත්න මැතිනිය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මැතිනිය, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, විසිර ගිය අයවලුන්ගේ දෙමාපියන් ඇතුළු විශාල පිරිසක් ද එම අවස්ථාවට සහභාගී වූහ. යුද්ධ හමුදාවේ අනාගත උරුමකරුවන්ගේ එම අභිමානවත් විසිරයාම හා බැඳුණු විචිත්‍ර මතක සටහන් මෙහි දැක්වේ.









“දෙස බස රැස සුරැකීම උදෙසා වූ ජාතික මෙහෙවරට සිය තාරුණ්‍ය එක් කළ වීර දූ පුතුන්ගේ විසිරයාම එදින යුද්ධ හමුදා විද්‍යාපීඨයට ගෙන දුන්නේ සැබැවින්ම ආඩම්බරයකි. සිය වගකීම උරමත දරමින් යුද හමුදාවේ අභිමානය සුරැකීමට ඔවුන් සිය පළමු පා සටහන මෙලෙස තබනුයේ තිස් වසරක යුද ගිනි නිවාලූ විශිෂ්ට හමුදාවක අනාගත නියමුවරුන් ලෙසය”







# දෙස රකින වරම උරමතට

කෙඩෙට් නිලධාරීන් විසිරයාමෙන් අනතුරුව ඔවුන්ගේ උරහිසෙහි ජනාධිපති අධිකාරිය සංකේතවත් කරමින් නිල ලාංඡන පැළඳවීමේ උත්සවය එදින පස්වරුවේ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙන් "සිනෝ ලංකා මිත්‍රත්ව ශ්‍රවණාගාරයේදී (*Sino-Lanka Friendship auditorium*)" පැවැත්විණි. අභිමානවත් යුද්ධ හමුදාවේ අනාගත උරුමකරුවන්ගේ උරමතට දෙස රකින අනුලංගනීය වගකීම පැවරුණු ඓතිහාසික අවස්ථාවේ විචිත්‍ර මතක මෙහි දැක්වේ.

**"ඔබේ ක්‍රියාවන්හි ගුණාත්මකභාවය, සමානාත්මතාවය සහ ඔබේ අභිප්‍රායේ අඛණ්ඩතාව අනුව ඔබව විනිශ්චය කරනු ලබන්නේ වෙන කවරදාටත් වඩා ඔබේ කැපවීම රටට අවශ්‍ය වන බැවිනි. ඉවසීමෙන් සහ දයානුකම්පාවෙන් අන්‍යයන්ගේ අවශ්‍යතාවලට ඇහුම්කන් දීමට හැකි පුළුල් හදවතක් ඔබ සතු විය යුතු අතර, ඔබ ඔබේ වෘත්තීය ජීවිතයේදී ඕනෑම පීඩනයක් දරාගනිමින් එයට තනිව මුහුණ දීමේ හැකියාව සහ ඒ පිළිබඳ ඔබ කෙරෙහි උපරිම විශ්වාසයක් තිබිය යුතුයි"** - යුද්ධ හමුදාධිපති





# තවත් උපාධිධාරීහු පිරිසක් විසිර යති







සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක - 15 (*passed staff college*) සාර්ථකව හැදෑරූ විදේශීය නිලධාරීන් ඇතුළු ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට උපාධි ප්‍රදානය කිරීමේ උත්සවය ඉකුත් දෙසැම්බර් 10 වන දින සන්ධ්‍යාවේ නෙළුම් පොකුණ රඟහලේ දී පැවැත්විණි.

එහිදී, යුද්ධ හමුදා නිලධාරීන් 76 දෙනකු, නාවික හමුදා නිලධාරීන් 25 දෙනකු, ගුවන් හමුදා නිලධාරීන් 26 දෙනකු සමඟින් බංගලාදේශය, නේපාලය, පකිස්තානය, සෞදි අරාබිය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මාලදිවයින, රුවන්ඩා, සෙනගාලය හා ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් 146 දෙනකු වෙත උපාධි ප්‍රදානය කෙරිණි.

ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් අයිඑච්එම්එන්එන් හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ ආරාධනයකට අනුව රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආරක්ෂක), කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ හිටපු සේනාවිධායකවරු ඇතුළු ආරාධිතයන් රැසක් සහභාගී වූහ.



# අභිමන් දිනක බුහුමන් ලැබූ වගයි





ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් 09 වන දින අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ.

මෙවර උපාධි ප්‍රදානෝත්සවයේදී, එක් ආචාර්ය උපාධිධාරියකු, උපාධි අධ්‍යයන පීඨයේ ශාස්ත්‍රපති උපාධිධාරීන් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් 227 දෙනකු, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ විවිධ පීඨවල උපාධිධාරීන් 1180 දෙනකු ඇතුළු උපාධිධාරීහු 1408 දෙනකු උපාධි හිමිකර ගත්හ.

ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා වර්ෂ 1981 දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී. මෙම ආරක්ෂක විශ්වවිද්‍යාලය වර්ෂ 2007 දී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කරන ලදී. ඒ අනුව, වර්ෂ 2012 සිට සිවිල් සිසුන්ට ද එහි අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි විය. වර්තමානයේදී, ත්‍රිවිධ



හමුදා නිලධාරීන්ට පමණක් සීමානොවී දේශීය හා විදේශීය සිසුන්ට ද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධි, පශ්චාත් උපාධි සහ පශ්චාත් ඩිප්ලෝමා උපාධි හැදෑරීමට හැකියාව පවතී.

දැනට ලොව පිළිගත් විශ්වවිද්‍යාලයක් වන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකයෙකි.

මෙම උපාධි ප්‍රදානෝත්සවයට අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, තානාපතිවරු හා මහකොමසාරිස්වරු, ආරක්ෂක ලේකම් හා අනෙකුත් අමාත්‍යංශ ලේකම්වරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, පොලිස්පති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති සහ එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.







# ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ “වර්ණ රාත්‍රිය”





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඇගයීමට ලක් කිරීමේ අරමුණින් වාර්ෂිකව පවත්වනු ලබන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා "වර්ණ රාත්‍රිය" ඉකුත් දෙසැම්බර් 12 වන දින නෙළුම් පොකුණ රඟහලේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව පසුගිය වසර කිහිපය පුරාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට විශිෂ්ට ක්‍රීඩකයන් රැසක් බිහි කළ අතර, මෙම උත්සවයේදී සේවයේ නියුතු සහ විශ්‍රාමික එම ක්‍රීඩකයන් ඇගයුමට ලක් කරමින් ඔවුන්ට සමරු තිළිණ සහ සහතිකපත් ප්‍රදානය කෙරිණ.



යුද්ධ හමුදා, ආරක්ෂක සේවා, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ඉසව්වලදී විශිෂ්ට දක්ෂතා දැක්වූ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ නිලධාරීන් සහ සෙසු නිලයන් 248 දෙනකුට (සේවය කරන සහ විශ්‍රාම ගිය) ඔවුන්ගේ දක්ෂතා අගය කරමින් මෙහිදී රෙජිමේන්තු සහ යුද්ධ හමුදා වර්ණ ප්‍රදානය කෙරිණි. මෙම වර්ණ රාත්‍රිය සංස්කෘතික නර්තන අංගයන්, සංගීතමය වැඩසටහන් සහ සිත් ඇදගන්නා සුළු සංදර්ශනවලින් වර්ණවත් විය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය, කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමිණී කොටුවේගොඩ ඇතුළු තවත් පිරිසක් එක්වූහ.









# මව් බිමේ අභිමානය රැගෙන එතෙර මෙහෙයට





එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් යටතේ දකුණු සුඩානයේ පවත්වාගෙන යනු ලබන දෙවන මට්ටමේ රෝහලේ රාජකාරී සඳහා පිටත්ව යන ශ්‍රී ලංකා වෛද්‍ය බලකායේ 8 වන බලඇණියේ පළමු කණ්ඩායම පසුගිය දෙසැම්බර් 29 වන දින උදෑසන දිවයිනෙන් පිටත්ව ගියහ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී දිවයිනෙන් පිටත්ව යන එම කණ්ඩායම වෙත සිය සුබපැතුම් පිරිනැමීම සඳහා එක්විය.



නිලධාරීන් 11 ක් සහ සෙසුනිලයින් විසිදෙදෙනෙකුගෙන් සමන්විත එම කණ්ඩායම ගුවන් තොටුපළ පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපතිතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාර පුද කළහ. එහිදී ඔවුන් වෙත සුබපැතුම් එක්කළ යුද්ධ හමුදාධිපති එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීවලදී ඉහළ විනයක් පවත්වා ගනිමින් තම රාජකාරි ඉතා වගකීමෙන් සහ කාර්යක්ෂමව ඉටුකිරීමේ අවශ්‍යතාවය  අවධාරණය කළේය.



ශල්‍ය විශේෂඥ වෛද්‍ය බ්‍රිගේඩියර් කේජීකේඑච් විජේවර්ධන ආර්එස්පී යූඑස්පී සමගින් විශේෂඥ වෛද්‍යවරු 4 දෙනෙකු සහ වෛද්‍ය නිලධාරීන් 13 දෙනෙකු ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින් 66 දෙනෙකුගෙන් සමන්විත එම ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ 8 වන බලඇණියට ලුතිනන් කර්නල් එන්එම් නිෆ්ලාර් යූඑස්පී විසින් අණදීම සිදුකරනු ලබයි.



# ඉන්දීය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීට අවසන් ගෞරව

අභාවප්‍රාප්ත ඉන්දීය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් බිපින් රාවට් (*General Bipin Rawat*) සහ එතුමන්ගේ භාර්යාව වන මධුලිකා රාවට් මැතිනිය ගේ (*Mrs Madhulika Rawat*) දේහ පිළිබඳ අවසන් කටයුතු පූර්ණ හමුදා ගෞරවාචාර මධ්‍යයේ පසුගිය දෙසැම්බර් 10 වන දින පස්වරුවේ ඉන්දියාවේ නවදිල්ලි නුවර, ධවුලා ක්වාන්හි (*Dhaula Quan*) පිහිටි බ්‍රාර් ආදාහනාගාරයේදී සිදු කෙරිණි.

දේහයන්ට අවසන් ගෞරව දැක්වීම සඳහා අමාත්‍යවරු, දේශීය හා විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන්, ඉහළ පෙළේ හමුදා නිලධාරීන්, ඉන්දීය රජයේ පරිපාලන නිලධාරීන්, ඉන්දීය ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ. එමෙන්ම ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ද එම අවස්ථාවට එක්වූ අතර, එහිදී ඔහු අභාවප්‍රාප්ත ඉන්දීය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ගේ දියණියන් හමුවී සිය බලවත් ශෝකය ප්‍රකාශ කරමින් විශේෂ ශෝක පණිවිඩයක් ද භාර දුන්නේය.





# අභ්‍යාසලාභීන් සඳහා නව නේවාසිකාගාරයක්






ත්‍රිකුණාමලයේ ස්ථාපිත යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන විද්‍යාලය මෙරට විශාලතම ශ්‍රම බලකායේ අත්‍යවශ්‍ය පරිපාලන කාර්යයන් සඳහා පුහුණුව ලබා දෙන ප්‍රමුඛතම ආයතනයකි. එම විද්‍යාලයේ අභ්‍යාසලාභීන් සඳහා නවතමයෙන් ඉදිකරනු ලැබූ මහල් නවාතැන් සංකීර්ණයක් ඉකුත් නොවැම්බර් 27 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් විවෘත කෙරිණ.

හටකාර්ය සම්පාදන විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඒආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී, ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ටීඑම් අබේරත්න ආර්එස්පී එල්එස්සී ඇතුළු නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

# ඓතිහාසික ෆෙඩ්‍රික් බලකොටුවේ ඉදිවූ "ඇටිපොල නිවාඩු බංගලාව"






ෆෙඩ්‍රික් බලකොටුවේ ස්ථාපිත 2 වන (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තු කඳවුරු පරිශ්‍රයේ මනරම් පරිසරයක සුවපහසු කාමර හතරකින් සමන්විතව ඉදිකරනු ලැබූ "ඇටිපොල නිවාඩු බංගලාව" ඉකුත් නොවැම්බර් 27 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් විවෘත කෙරිණ.

ෆෙඩ්‍රික් කොටුව තුළ හමුදා කඳවුරු, ඉහළ නිලධාරීන්ගේ නිල නිවාස යනාදිය එකල පිහිටා තිබී ඇත. වර්තමානයේ සංචාරකයන් නිතර ගැවසෙන ස්ථානයක්ව ඇති ගෝකණ්ණ විහාරය හා කෝනේෂ්වරම් කෝවිලද පිහිටා ඇත්තේ එහිය. එම මනරම් පරිසරයේ ඉදිකරනු ලැබූ මෙම "ඇටිපොල නිවාඩු බංගලාව" 2 වන (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවේ හටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන් ඉංජිනේරු සේවා බලකායේ හට පිරිස්වල ඉංජිනේරු සහ තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් ඉදිකරන ලදී.

# කමාන්ඩෝ රෙජිමේන්තුවේ ඉදි කෙරෙන කාර්යාල සංකීර්ණයට මුල්ගල තැබේ





ගනේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ ඉදි කිරීමට යෝජිත නව කාර්යාල සංකීර්ණයට මුල්ගල් තැබීමේ අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් දෙසැම්බර් 02 වන දින සහභාගී විය.

එහිදී, හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය මධ්‍යයේ කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයට සපැමිණි යුද්ධ හමුදාධිපති කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ 14 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩීසී පීඑස්සී සමඟින් 65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ් සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, කමාන්ඩෝ රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒඑස්පී සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් වීඑම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. කමාන්ඩෝ රෙජිමේන්තුවට කලක පටන් පැවති විශාල අඩුපාඩුවක් සපුරාලමින් ඉදිකෙරෙන මෙම කාර්යාල සංකීර්ණය එම රෙජිමේන්තුවේ අභිමානය තවදුරටත් තීව්‍ර කරවන්නකි.

---


# කෙඩෙට් නිලධාරීන්ගේ හමුවක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පුහුණුව සාර්ථකව අවසන් කර නුදුරේදී අධිකාරියට පත්වීමට නියමිත කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 89, 89*B*, 90, ස්වේච්ඡා පාඨමාලා අංක 60 සහ කාන්තා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 17 ට අයත් කෙඩෙට් නිලධාරීන්, නිලධාරිනියන් මෙන්ම සැම්බියා, රුවන්ඩා හා මාලදිවයින යන රටවලට අයත් විදේශීය කෙඩෙට් නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ඉකුත් නොවැම්බර් 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරී පාඨමාලාවේ අවසන් ඉදිරිපත් කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් කෙඩෙට් නිලධාරීන් යුද්ධ හමුදාධිපතිතුමන් හමුවන අතර එහිදී "ඇෆ්ගනිස්ථානයේ තලෙයිබාන් සංවිධානයේ නැගී සිටීම සහ දකුණු ආසියා කලාපයේ අන්තවාදයට සහ ත්‍රස්තවාදයට එහි බලපෑම" *(Rise of Taliban in Afghanistan and its Spillover Effects to South Asia Region's Extremism and Terrorism*') යන තේමාව යටතේ සම්මුඛ සාකච්ඡාවක් ද පවත්වන ලදී. තවද එහිදී "කොවිඩ්" වෛරසය මෙරට පැතිරයාම වැළැක්වීම සඳහාත් ජාතික එන්නත්කරණ වැඩසටහන දියත් කිරීම සඳහාත් යුද්ධ හමුදාවේ දායකත්වය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ ආකාරය පිළිබඳව ද සාකච්ඡා කෙරිණ.



# සුහද හමුවක්





ශ්‍රී ලංකාවට සපැමිණි රුසියානු සමූහාණ්ඩුවේ සන්නද්ධ හමුදාවන්හි ඉංජිනේරු හමුදා ප්‍රධානී ලුතිනන් ජෙනරාල් යූරි මිහයිලොවිච් ස්ටාවිට්ස්කි (***Lieutenant General Yuri Mikhailovich Stavitsky***) ප්‍රමුඛ හමුදා නියෝජිත පිරිස ඉකුත් නොවැම්බර් 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමු වූහ. රුසියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ද්විපාර්ශ්වික හමුදා සහයෝගීතා වැඩසටහන යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සහ බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු තවදුරටත් කඩිනම් කිරීම සඳහා අවැසි උසස් තාක්ෂණික දැනුම සහ මාර්ගෝපදේශ ලබාදීම මෙම සංචාරයේ අරමුණ විය.

රුසියානු දූත පිරිස පසුගිය නොවැම්බර් 24 වන දින කඩ්ඩුවාන් සහ මුහමාලේ ප්‍රදේශවල සංචාරයක නිරත වෙමින් එම ප්‍රදේශවල ශ්‍රී ලංකා යුද්ධ හමුදා මානුෂීය බිම්බෝම්බ ඉවත්කිරීමේ ඒකකය වෙතින් සිදුකරනු ලබන බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු පිළිබඳ සිදුකළ නිරීක්ෂණයන්ට අදාළව වැඩිදියුණු කරගත යුතු කරුණු පිළිබඳ එහිදී යුද්ධ හමුදාධිපති දැනුවත් කරන ලදී.



ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපතිනි අතිගරු රීටා ජුලියානා මැනෙල්ලා මහත්මිය (*HE Mrs Rita Juliana Mannella*) ඉකුත් දෙසැම්බර් 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමු වූවාය. මෙම සුහද හමුවේදී දෙරට අතර පවත්නා සුහදත්වය සහ සහයෝගීතාවය පිළිබඳ අවධානය යොමු කළ අතර, එහිදී කොවිඩ්-19 වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා එම ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී ලෙස යුද්ධ හමුදාධිපති ඉටු කරන මෙහෙවර ද ඇයගේ පැසසුමට බඳුන් විය.

# "*The Conflict that Eluded Peace*" කෘතිය එළිදැක්වේ



හිටපු ආරක්ෂක ලේකම් සහ 17 වන යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශාන්ත කෝට්ටේගොඩ (විශ්‍රාමික) විසින් රචිත *'The Conflict that Eluded Peace'* කෘතිය පසුගියදා ප්‍රකාශයට පත් කෙරිණ. එහි පිටපතක් ඉකුත් නොවැම්බර් 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත පිළිගන්වන ලදී.

*'The Conflict that Eluded Peace'* නම් විශිෂ්ට කෘතිය වසර 30 කට අධික කාලයක් පැවැති එල්ටීටීඊ ත්‍රස්තවාදී ගැටුමේදී ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සැබෑ ශ්‍රී ලාංකීය දූ පුතුන් ලෙස මෙරටින් ත්‍රස්තවාදය තුරන් කර මව්බිම එක්සේසත් කිරීම උදෙසා දැක්වූ නිර්භීතකම ආවර්ජනය කරනු ලබන අමරණීය මතකයන් රැසකින් සමන්විත වේ.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හිටපු රණශූරයකු වූ ජෙනරාල් ශාන්ත කෝට්ටේගොඩ (විශ්‍රාමික) විසින් එල්ටීටීඊ ත්‍රස්තවාදයේ ම්ලේච්ඡ ක්‍රියාදාමයන් සහ ශ්‍රී ලාංකීය රණවිරුවන් සිය මව්බිමට සාමය උදා කරදීම වෙනුවෙන් සිදුකළ මෙහෙවර පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම කෘතියේ අන්තර්ගත කර ඇත. තවද, එල්ටීටීඊ ත්‍රස්තවාදය සමඟ යුද වැදී ලබාගත් ජයග්‍රහණ, එතුළින් උගත් පාඩම් හා සාකච්ඡාමය වශයෙන් දේශපාලනික විසඳුමක් ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් යුදමය ජයග්‍රහණයක් හිමිකර ගැනීම වෙනුවෙන් සිදුකරනු ලැබූ මානුෂීය මෙහෙයුම පිළිබඳව මෙම කෘතිය තුළින් අනාවරණය කෙරේ.

හිටපු ආරක්ෂක ලේකම් සහ 17 වන යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශාන්ත කෝට්ටේගොඩ (විශ්‍රාමික) සිය 35 වසරකට වැඩි යුද්ධ හමුදා දිවියෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව බ්‍රසීලයේ සහ තායිලන්තයේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් උසස් රාජ්‍ය තාන්ත්‍රික තනතුරු කිහිපයක්ද ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් තනතුර ද හෙබවූයේය.

# කාබනික පොහොර කිලෝග්‍රෑම් 91,000 ක් සිවිල් වැසියන් වෙත




ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටපිරිස් මහ කන්නයේ කෘෂිකාර්මික අවශ්‍යතාවන් සඳහා මීට පෙර ලබාදුන් කාබනික පොහොරවලට අමතරව අලුතින් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කිලෝග්‍රෑම් 91,000 ක ප්‍රමාණයක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 27 වන දින 22 වන සේනාංක මූලස්ථානයේ පැවති උත්සවයකදී සීමාසහිත ලංකා පොහොර සමාගම (ලක් පොහොර) වෙත භාරදෙන ලදී.

නුදුරේදී යුද්ධ හමුදාවේ කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිවයින පුරා ස්ථාපිත සියලුම බළඇණිවල මෙම ව්‍යාපෘතිය ඇරඹීමට නියමිතය. කාබනික පොහොර ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය - නැගෙනහිර විසින් නිෂ්පාදනය කරන ලද මෙම පොහොර තොගය ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මාර්ගෝපදේශ මත නැගෙනහිර හට පිරිස්වල සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෙලෙස බෙදා හැරීමට හැකිවිණි.

යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන මගින් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ලබා දෙනුයේ නොමඳ සහයකි. ආරක්ෂක සේනා මූලස්ථාන හරහා මේ වන විට කාබනික පොහොර ටොන් 25,000 කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරමින් මෙම ජාතික ව්‍යාපෘතිය සඳහා දායක වී ඇත.

# යුද හමුදා යුද විද්‍යාලය






ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂක ක්‍රමවේදයන්ට අනුකූල වීමට සහ ආරක්ෂාව හා ආරක්ෂක උපායමාර්ග පිළිබඳ මනා දැනුමකින් සමන්විත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බිහිකිරීම වෙනුවෙන් යුද්ධ හමුදා විද්‍යාපීඨ පරිච්ඡේදයට නව පිටුවක් එක් කරමින් බුත්තල පිහිටි නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය 2021 දෙසැම්බර් මස 17 වන දින සිට "යුද හමුදා යුද විද්‍යාලය" ලෙස වැඩිදියුණු කරනු ලැබිය.

ලෝකයේ ප්‍රචලිත ප්‍රමිතීන්ට ගැළපෙන පරිදි උසස් තීක්ෂණ බුද්ධියකින් හෙබි සහ ගැටලු නිරාකරණය කරන්නන් බිහිකිරීමේ අභිප්‍රායෙන් මෙම නව යුද විද්‍යාලය ස්ථාපිත කරනු ලබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිවෘද්ධිය වෙනුවෙන් "ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" සංකල්පය හඳුන්වා දෙමින් එය යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙන් පෙරමුණ ගෙන කටයුතු කරනු ලබන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් පසුගිය දෙසැම්බර් 17 වන දින යුද හමුදා යුද විද්‍යාලය විවෘත කිරීමේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

යුද හමුදා යුද විද්‍යාලයේ නිල වෙබ් අඩවිය (*https://alt.army.lk/awc/*) විවෘත කිරීමද එහිදී ප්‍රධාන ආරාධිත අමුත්තා අතින් සිදුවිය. මෙම අවස්ථාවට යුද හමුදා යුද විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු පිරිසක් එක්වූහ.

# ගැමුණු හේවා බළඇණියට නව නිලධාරී නිවස්නයක්



බුත්තල නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය (*OCDC*) යුද හමුදා යුද විද්‍යාලය බවට පරිවර්තනය කිරීමේ උත්සව අවස්ථාවට සහභාගී වූ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ඊට නුදුරින් පිහිටි 18 වන ගැමුණු හේවා බලඇණියේ නවතමයෙන් ස්ථාපිත කරනු ලැබූ නිලධාරී නිවස්නය විවෘත කිරීම සඳහා ද එක්විය.

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සහ ගැමුණු හේවා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපතිතුමන් *Zoom* තාක්ෂණය ඔස්සේ නව නිලධාරී නිවස්න සංකීර්ණයේ ඡායාරූප නැරඹීමෙන් අනතුරුව සංකේතාත්මකව නව ගොඩනැගිල්ල විවෘත කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන සංඥා නිලධාරී සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් පීජ්ජේ පීරිස් එන්ඩීයූ සහ නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එක්ව සිටියහ.












# යුද්ධ හමුදා නත්තල් කැරොල් නෙළුම් පොකුණ රඟහලේදී

ප්‍රීතිමත් නත්තලේ උදාව සනිටුහන් කරමින් යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කරනු ලැබූ "යුද්ධ හමුදා නත්තල් කැරොල් ගී ප්‍රසංගය" පසුගිය දෙසැම්බර් 22 වන දින පස්වරුවේ නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණි. යුද්ධ හමුදා ගායන කණ්ඩායමේ සහ තූර්ය වාදක කණ්ඩායම් වල විචිත්‍රවත් සංගීතාස්වාදයෙන් වර්ණවත් වූ මෙම ප්‍රසංගය කැරොල්, යාඥා, නැටුම්, ගීතිකා සහ අනෙකුත් අංගයන්ගෙන් සමන්විතව ජනප්‍රිය ගායක ගායිකාවන් රැසකගේ ද සහභාගීත්වයෙන් අති උත්කර්ෂවත් ලෙස පැවැත් වූහ.

යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන අමුත්තිය ලෙස ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මැතිනිය එක්වූවාය. තවද මෙම නත්තල් කැරොල් වැඩසටහනට ආරක්ෂක ලේකම් හා එම මැතිනිය, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා එම මැතිනිය, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති හා එම මැතිනිය, නාවික හා ගුවන් හමුදාධිපතිවරු හා එම මැතිනියන්, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ඇතුළු තවත් සම්භාවනීය ආරාධිතයන් පිරිසක් ද සහභාගී වූහ.

# යුද්ධ හමුදා මූලස්ථානයේ නත්තල් අසිරිය







ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික විවිධත්වයට සැබෑ අරුතක් එක් කරමින් සංහිඳියාවේ හා සහෝදරත්වයේ ඉපැරණි සබඳකම් තවදුරටත් වැඩිදියුණු කරමින් "සාමයේ කුමරා" වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සතිටුහන් කරන නත්තල් දිනය වෙනුවෙන් යුද්ධ හමුදා මූලස්ථානය හා ඒ අවට මාර්ග නෙත් සිත් ඇදගන්නා අයුරින් අලංකාරවත් කෙරිණ. එහිදී මධ්‍යම පරිසර අධිකාරිය මංසන්ධියේ සිට යුද්ධ හමුදා මූලස්ථානය දක්වා දිවෙන මාර්ගය දෙපස එලෙස නත්තල් සැරසිලි වලින් අලංකාරවත් කර තිබූ අතර යුද්ධ හමුදා මූලස්ථානයේ මූලස්ථාන බලඇණියේ භට පිරිස් වල ශ්‍රම දායකත්වයෙන් එම සැරසිලි සිදු කරනු ලැබූහ.

භටකාර්ය සම්පාදන අණසක මූලස්ථානයේ ආඥාපති සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදා නත්තල් කලාපය විවෘත කිරීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් ඉකුත් දෙසැම්බර් 23 වන දින සන්ධ්‍යාවේ සිදු කෙරිණ.

මෙම අවස්ථාවේදී සැබෑ නත්තල් ආශ්වාදයන් ලොවට විදහා පාමින් යුද්ධ හමුදා තූර්යවාදක හා රංග කලා අධ්‍යක්ෂ මණ්ඩලයේ ගායක කණ්ඩායම විසින් නත්තල් කැරොල් ගීතිකා ගායනා කරමින් යේසුස් වහන්සේ වෙත ප්‍රශංසා කළහ. එම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.




# අභිමන් සෙවණක ගෞරවනීය ඇරඹුමක්







ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 59 වන මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ 2021 දෙසැම්බර් 09 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි සිය කාර්යාලයේදී ආගමික වතාවත් මධ්‍යයේ රාජකාරි භාර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ධූරය ද හොබවන එතුමන් යුද්ධ හමුදාධිපති ගේ නිර්දේශ මත මෙම ධූරයේ රාජකාරී භාරගැනීමට ප්‍රථම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස ද කටයුතු කළේය.

1986 ඔක්තෝබර් 27 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය පාඨමාලා අංක 26 යටතේ කෙඩෙට් නිලධාරියකු ලෙස යුද්ධ හමුදාවට එක්ව ඇති ඔහු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ හා පකිස්තාන හමුදා ඇකඩමියේ මූලික පුහුණුව ලැබ වෙනත් දෙස් විදෙස් පාඨමාලා රැසක් ද හදාරා ඇති රණකාමී ගජබා රෙජිමේන්තුවෙන් බිහිවූ අත්දැකීම් සපිරි දක්ෂ නිලධාරියෙකි.

වසර 35 කට වැඩි සේවා කාලයක් සහිත අයකු වූ ඔහු රණබිමේ බොහෝ අත්දැකීම් ඇත්තෙකි. සිය තනතුර හරහා යුද්ධ හමුදාවටත් රටටත් විශිෂ්ට මෙහෙයක් ඉටු කිරීමට නව මාණ්ඩලික ප්‍රධානී ට දිරිය ශක්තිය ලැබේවායි "රණවිරුවා" ද මෙසේ සුබපැතුම් එක් කරයි.

# අභිමන් සේවණක ගෞරවනීය ඇරඹුමක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ 2021 දෙසැම්බර් 21 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි සිය කාර්යාලයේදී ආගමික වතාවත් මධ්‍යයේ රාජකාරී භාර ගන්නා ලදී.



එම තනතුර භාරගැනීමට ප්‍රථම ඔහු ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති ලෙස කටයුතු කළ අතර, වර්තමානයේ හෙතෙම ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ධූරයද හොබවයි. වසර 35 කට වැඩි සේවා කාලයක් සහිත අයකු වන නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී යුද්ධ හමුදාවේ විවිධ ජ්‍යේෂ්ඨ තනතුරු රැසක් දරා ඇති පරිණත නිලධාරියෙකි.



1986 ඔක්තෝබර් 27 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය පාඨමාලා අංක 26 යටතේ කෙඩෙට් නිලධාරියකු ලෙස යුද්ධ හමුදාවට එක්ව ඇති ඔහු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ හා පකිස්තාන හමුදා ඇකඩමියේ මූලික පුහුණුව ලැබ වෙනත් දෙස් විදෙස් පාඨමාලා රැසක් ද හදාරා ඇති අයෙකි. යුද බිමෙහි ද බොහෝ අත්දැකීම් සපිරි දක්‍ෂ නිලධාරියකු වූ නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ට සිය තනතුර හරහා යුද්ධ හමුදාවටත් රටටත් විශිෂ්ට මෙහෙයක් ඉටුකිරීමට දිරිය ශක්තිය ලැබේවායි "රණවිරුවා" ද මෙසේ සුබපැතුම් එක්කරයි.

# ඓතිහාසික ස්වේච්ඡා බළසේනාවට ගෞරවනීය ඇරඹුමක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 48 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය දෙසැම්බර් 15 වන දින රාජකාරී භාර ගන්නා ලදී. ඒ නිමිත්තෙන් සාලාව කොස්ගම පිහිටි ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී සංවිධානය කෙරුණු අභිමානවත් වැඩසටහනේදී නව සේනාවිධායක වෙත හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි. ආගමික වතාවත් මධ්‍යයේ පැවති එම වැඩ භාරගැනීමේ අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු එම මූලස්ථානයට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක්ද එක්වූහ. ඓතිහාසික ස්වේච්ඡා බළසේනාවේ අභිමානය පෙරදැරිව යුද්ධ හමුදාවේ හා රටේ අවශ්‍යතා හඳුනා ගනිමින් අභිමානවත් මෙහෙවරක නියැළෙන්නට හැකි වේවායි නව ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක වෙත "රණවිරුවා" ද සුබ පැතුම් එක්කරයි.



# හෙට ලොව දිනන්න විරු දූ පුතුනට සවියක්ව



ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය/අතුරුදහන්/ආබාධිත සහ සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ හා යුද්ධ හමුදාවේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූවා දරුවන් අතරින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අපොස (සා/පෙළ) හා අපොස (උ/පෙළ) යන විභාගවලින් විශිෂ්ට දක්ෂතා දැක්වූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදීමේ උත්සවයක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 23 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි.





2021 වර්ෂය වෙනුවෙන් පවත්වන ලද මෙම ශිෂ්‍යත්ව පරිත්‍යාග කිරීමේ වැඩසටහන සඳහා සියලු රෙජිමේන්තු ආවරණය වන පරිදි දූවා දරුවන් 115 දෙනකු සුදුසුකම් ලැබූ අතර, මේ සඳහා රුපියල් ලක්ෂ 30 කට අධික මුදලක් වැයකරන ලදී. එහිදී 2020 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 192 කට වඩා ලබාගත් දරුවන් 24 දෙනකු සඳහා එක් අයකුට රුපියල් 20,000.00 ක බැංකු තැන්පතුවක් සහ පාසල් උපකරණ කට්ටලය බැගින් ද, 2019 වර්ෂයේ අපොස (සා/පෙළ) විභාගයෙන් "*A*" සාමාර්ථ 09 ක් ලබාගත් දරුවන් 59 දෙනෙක් සඳහා එක් අයකුට රුපියල් 25,000.00 ක බැංකු තැන්පතුවක්, වටිනා ශබ්දකෝෂයක් සහ පාසල් උපකරණ කට්ටලය බැගින්ද අපොස (උ/පෙළ) විභාගයෙන් ඉහළම "*Z Score*" අගයක් ලබාගත් දරුවන් 32 දෙනකු සඳහා එක් අයකුට රුපියල් 30,000.00 ක බැංකු තැන්පතුවක් සහ වටිනා ශබ්දකෝෂය බැගින්ද එහිදී පිරිනැමිණ.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ගේ උපදෙස් හා මඟපෙන්වීම මත ක්‍රියාත්මක මෙම මාහැඟි සත්කාරය තුළින් හෙට ලොව දිනන විරු දරු කැළට තිබඳ ශක්තියක් එක්කරනු නිසැකය.

# සේවා වනිතා සේවය තවදුරටත් පුළුල් කරමින්








යුද්ධයේදී මියගිය, ආබාධිත තත්වයට පත් හා සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහ යුද්ධ හමුදාගත සිවිල් අයවලුන්ගේ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන ව්‍යාපෘතියන් ලෙස නාරාහේන්පිට මැනිංටවුන් යුහ විවාහක නිවාස පරිශ්‍රයේ සුබසාධක වෙළඳසැල, ජන අවන්හල සහ සුබසාධක බේකරිය පවත්වාගෙන යනු ලබයි. එමඟින් සහනදායි මිල ගණන් යටතේ යුද්ධ හමුදා සහ සිවිල් අයවලුන් වෙනුවෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, වියළි ආහාර, කෙටි ආහාර සහ ක්ෂණික ආහාර ලබාදීම මෙන්ම බේකරි නිෂ්පාදන අවශ්‍යතාවන් ලබාදීමද සිදු කරයි.

ඉහත සේවා තවදුරටත් පුළුල් කරමින් එම වෙළඳසැල් සංකීර්ණය තුළ බේකරියක්, ආපන ශාලාවක්, පිරිමි කරණවෑම්හලක්, කාන්තා රූපලාවණ්‍යාගාරයක් සහ කාන්තා/පිරිමි මැහුම්හලකින් සමන්විත සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් ලෙස වැඩිදියුණු කිරීමට මේ වනවිට වැඩකටයුතු ආරම්භ කර ඇත. එහි ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය ඉකුත් දෙසැම්බර් 04 වන දින එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) බ්‍රිගේඩියර් ටීඑස් බාලසූරිය ඇතුළු නිලධාරීන්, නිලධාරිනියන් පිරිසක් ද සහභාගී වූහ.

# නිවාස සිහිනය සැබෑ කරගැනීමට සේවා වනිතාවෙන් අතහිත





සෙබළ සුබසාධනය පිණිස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අතුරෙන් නිවාස ආධාර ලබාදීම ප්‍රමුඛත්වයක් ගනී.

ඒ අනුව ආර්ථික සහ සමාජීය ගැටලු හමුවේ තම නිවාස සිහිනය සැබෑ කරගැනීමට නොහැකිව සිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු කිහිපයකට අයත් නිලධාරීන් සහ සෙසුනිලයන් 05 දෙනකු හට දෙසැම්බර් මසට අදාළව නිවාස ඉදිකිරීම් සඳහා මූල්‍ය පරිත්‍යාග ලබාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එතුමියගේ නිල කාර්යාලයේදී ඉකුත් දෙසැම්බර් 06 වන දින පැවැත්විණ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් විසින් රණවිරු සුවතා මධ්‍යස්ථානයන්හි නේවාසිකව සිටින කොවිඩ් වෛරසය වැළඳී ප්‍රතිකාර ගනු ලබන රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වාෂ්ප යන්ත්‍ර *(Steamer) 45* ක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත භාරදීමද එහිදී සිදුකරනු ලැබූහ.

# ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සජීවනී පීරිස් මහත්මිය සහ එම ශාඛාවේ සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් කොරෝනා වෛරසය හේතුවෙන් අන්තර්ජාල අධ්‍යාපන පහසුකම් සපයාගත නොහැකි ආර්ථික දුෂ්කරතාවන්ගෙන් පෙළෙන සෙසුනිලයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ අයවලුන්ගේ දූවා දරුවන් වෙනුවෙන් රුපියල් 34000.00 ක් වටිනා ටැබ්ලට් පරිගණක බෙදාදීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 04 වන දින පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ආරක්ෂක අංශ සාමාජිකයින්ට උපකාර කිරීම සඳහා 2009 වර්ෂයේ ආරම්භ කරන ලද රණවිරු අරමුදලේ ප්‍රතිඵලයක් ලෙස එහි ලේකම් යශෝධා ජයවර්ධන මහත්මියගේ සම්පූර්ණ මැදිහත්වීම යටතේ මෙම පරිත්‍යාගය සඳහා නවසීලන්තයේ එක්සත් ශ්‍රී ලංකා සංගමයේ **(United Sri Lanka Association)** මූල්‍ය අනුග්‍රහය සපයන ලදී.



# ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව




ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ගීතා අතුකෝරල මහත්මිය පසුගිය දෙසැම්බර් 08 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී වැඩ භාර ගන්නා ලදී. එම අවස්ථාව සඳහා ගැමුණු හේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 13 වන සභාපතිනිය ලෙස කුමුදු මානගේ මහත්මිය ඉකුත් නොවැම්බර් 22 වන දින සිය ධූරයේ රාජකාරී අරඹන ලදී. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ. එහි විශේෂ අවස්ථාවක් ලෙස රෙජිමුබ ව්‍යාපාරෙට අයත් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් සිටින පූර්ණ ආබාධිත සෙ/500929 සැරයන් බන්නක බීඑම්ජ්එස් යන ජ්‍යෙකොනොති හට රුපියල් 138,072.00 ක වටිනාකමකින් යුත් නාන කාමර කට්ටලයක් පරිත්‍යාග කිරීමද නව සභාපතිතුමිය ගේ වැඩ භාර ගැනීමට සමගාමීව සිදු කෙරිණ.

# සන්නද්ධ බුද්ධි බළකා සේවා වනිතා ශාඛාව

සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ඉකුත් නොවැම්බර් 27 වන දින මියගිය සහ ආබාධිත රණවිරුවන් හට සෙත් පතා වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත ආහාර වේලක් ලබාදීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය මනෝරි සලේ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකා මනෝරි අමිත් මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූහ. තවද එදින එම වැඩිහිටි මධ්‍යස්ථානයේ නේවාසික වැඩිහිටියන් 11 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම ද සිදු කෙරිණ.



# ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාව



ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත කළුතර සුජාතා වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් සඳහා අවැසි අත්‍යවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහනක් 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංවිධානයෙන් ඉකුත් නොවැම්බර් 26 වන දින සිදුකරන ලදී.

# ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකායේ කාලතුවක්කු බළඇණිය යටතේ සේවය කරනු ලබන සෙ/629258 කෝප්‍රල් රුවන් ටීඑච්අයිඒ යන කොනොති ගේ බිරිඳගේ අංශභාග රෝගයට ගොදුරු වූ මව වෙත රෝද පුටුවක් පරිත්‍යාග කිරීම පසුගියදා 3 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකා සේවා වනිතා ශාඛා සභාපතිනිය ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. මෙම වැඩසටහනට සමගාමීව සිවිල් සේවක මහතුන් කිහිප දෙනකු වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ පිරිනැමීමක් ද මෙහිදී සිදු කෙරිණ.




# ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා සේවා වනිතා ශාඛාව

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ සාමාර්ථ ලබාගත් දරුවන් 05 දෙනකු හා විශ්වවිද්‍යාල ප්‍රවේශලාභී දරුවකු වෙනුවෙන් රුපියල් 10000.00 බැගින් ශිෂ්‍යාධාර හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 28 වන දින පොලිස් හේවා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා එම ශාඛාවේ ගරු සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මිය, ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් සහ දෙමාපියන් පිරිසක්ද සහභාගී වූහ.





# "ත්‍රිවිධ පහර" සටනට පණ දුන්

# රණකාමියා



## නි/50981 කර්නල් ඒඑෆ් ලෆිර පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

මහනුවර නගරයේ ජනප්‍රිය වෛද්‍යවරයකු ලෙස සේවය කළ වෛද්‍ය ජී.ඒ මොහොමඩ් ලෆිර්ගේ හා එස්.එල් සිත්ති හනුල් ලෆිර් මැතිනියගේ අපේක්ෂා මල්ඵල ගන්වමින් සුරතල් දරු සිඟිත්තකු මෙලොව එළිය දුටුවේ 1958 වසරේ දෙසැම්බර් 26 වෙනිදාය.

ලෆිර් යුවළ සිය පුංචි කුමරාට අස්ලම් ෆස්ලි ලෆිර් යන නම තැබුවේය. පාසල් යායුතු වියට එළඹෙත්ම කන්ද උඩරට ප්‍රමුඛ පෙළේ පාසලකට තම දරුවා ඇතුළත් කිරීමට වෛද්‍ය ලෆිර් කල් ඇතිවම කටයුතු පිළියෙල කර තිබිණි. ඒ අනුව අස්ලම් ෆස්ලි ලෆිර් දරුවා 1964 දී කටුගස්තොට ශාන්ත අන්තෝනි විදුහල් මැණියන් සෙවණේ ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම ඇරඹීය.

අධ්‍යාපන කටයුතු ඇරඹූ මොහු නිතරම ශිෂ්‍ය වාර්තා පොතේ ඉහළම ලකුණු අතර රැඳී සිටි අතර, විද්‍යාලයේ පළමු පෙළ ක්‍රිකට් කණ්ඩායමේ තුන් ඉදිරියව්වෙන්ම දස්කම් දක්වන සාමාජිකයකු මෙන්ම බාලදක්ෂ ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස පාසලට මහත් කීර්තියක් අත්කර දුන්නේය. ෆස්ලි ලෆිර් සිසුවා සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග විශිෂ්ට අයුරින් ජයගත්තේ තමන් කෙරෙහි ආදරණීය මව්පියන් මෙන්ම ගුරු මණ්ඩලය ද තැබූ බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි. ගණිත අංශයෙන් ඔහු ලබා තිබූ උසස් ප්‍රතිඵල අනුව ඉංජිනේරු ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනයක් ලැබීමට අවශ්‍ය සියලුම සුදුසුකම් ඔහු සතු විය. මාපිය දෙපළගේ ප්‍රාර්ථනය වූයේද තම වැඩිමහල් පුතු අනාගතයේ ඉංජිනේරුවකු වනු දැකීමය. ඉහළ පෙළේ සමාජ සබඳතා ජාලයක් ඇතිව සිටි වෛද්‍ය මොහොමඩ් ලෆිර් තම පුතු වන ෆස්ලි ලෆිර් වෙනුවෙන් ලිබියානු විශ්වවිද්‍යාලයකට ඇතුළුවීම සඳහා වන අධ්‍යාපන ශිෂ්‍යත්වයක් තිළිණ කර දුන්නේය. ලිබියානු චාරිකාව පිළිබඳව ෆස්ලි ලෆිර් තරුණයා විවිධ කෝණවලින් විමර්ශනය කර බැලීය.

නමුත් එහිදී ඔහුගේ බුද්ධියත් හෘදය සාක්ෂියත් දිගින් දිගටම ඒත්තු ගැන්වූයේ උපන් බිමෙන් බැහැරව නොයන ලෙසටය.



මංගල සීනු හැඬවී, මුල් යුගයේදී

**මේජර් ලෆිර්ගේ නායකත්වය හා කැප කිරීම පළමුවන විශේෂ බළකායේ නාමය රණකාමී ඒකකයක් ලෙස බැබළවීමට හේතුවිය. රුදුරු ත්‍රස්තවාදී උවදුරෙන් මව්බිම මුදාගැනීමේ උදාර චේතනාවෙන් හමුදා ක්‍රියාන්විතවලදී විශේෂ බළකාය විසින් ඉටුකරනු ලැබූ අභිමානවත් මෙහෙවරට හිමිවිය යුතු ගෞරවයෙන් වැඩි කොටසක හිමිකම ලුතිනන් කර්නල් අස්ලම් ෆස්ලි ලෆිර්ට හිමිය.**

තරුණයකු වශයෙන් සමාජ ඇසුරෙහි අත්දැකීම් ලබා ගැනීම සඳහා කෙටි කාලයක් කැපකිරීම මැනවි යැයි ෆස්ලි ලෆිර්ට හැඟිණි. ක්‍රිකට් පිටියේදී හා බාලදක්ෂ මෙහෙවරේදී ලබා තිබූ අත්දැකීම් සමාජයත් සමග බෙදා හදා ගැනීමේ ආශාවක් ඔහු තුළ හට ගත්තේය.

උපතින්ම මුස්ලිම් ජාතිකයකු වුවද බහුතරයක් වූ සිංහල තරුණ ප්‍රජාව අතර ප්‍රමුඛයකු වීමට ඔහුට කිසිදු බාධාවක් නොවූයේ ඔහු ප්‍රගුණ කරගෙන තිබූ මානව හිතවාදී ගුණාංග හේතුවෙනි. තමාට ශිල්ප ලබාදුන් විදුහල් මාතාවට කෘතවේදීත්වය පළ කරනු වස් ලෆිර් ශාන්ත අන්තෝනි විද්‍යාලයීය ආදි  සිසු සංගමයට බැඳී පාසලේ උන්නතිය සඳහා විශාල මෙහෙවරක් ඉටු කළේය.

තම යෞවනත්වයේ හිණිපෙත්තට පා තබමින් සිටි ෆස්ලි ලෆිර් ක්‍රීඩා කෞශල්‍යය තුළින් ලබාගත් පෞරුෂත්වය ඔප්නංවා ගැනීම වස් නිල ඇඳුමක් ඇඟලා ගැනීමේ වූ දැඩි ආශාවකින් තම සිත වෙලා ගනිමින් තිබිණි. ලිබියාවට ගොස් ඉංජිනේරු විද්‍යාව හදාරණ ලෙස පියාණන් නැවත නැවතත් පෙරැත්ත කළත් තරුණ ලෆිර්ගේ නිල ඇඳුමට ඇති ආශාව ලිබියානු ශිෂ්‍යත්වයට වඩා ප්‍රබල විය. තම බලාපොරොත්තුව ද මුදුන්පත් කරගෙන යුද්ධ හමුදාවට බැඳී රට රැක ගැනීමේ ජාතික වගකීමට උරදීම සඳහා තමාට අවසරය දෙන මෙන් ඔහු නොකඩවා කළ ආයාචනයට අවසානයේ මව්පියන්ගේ අවසර ලැබිණ.

දිනය 1980 වසරේ අගෝස්තු මස 11 වෙනිදාය. මනා පෞරුෂයකින් හෙබි තරුණයෙක් දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨ පරිශ්‍රයට පිය නැගීය. ඔහු අනෙකකු නොව රට වෙනුවෙන් තම යුතුකම ඉටුකිරීමේ සිහිනය සැබෑ කර ගත් අස්ලම් ෆස්ලි ලෆිර් නමැති තරුණ කෙඩෙට් නිලධාරියාය.

කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 14 යටතේ තරුණ ලෆිර් පුහුණුව සඳහා යොමු කෙරිණි. සාර්ථක පුහුණුවකින් අනතුරුව 1982 පෙබරවාරි 27 වනදා ෆස්ලි ලෆිර් දෙවන ලුතිනන්වරයෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි අධිකාරියට පත්වූයේ සමස්ත පාඨමාලාවේ දෙවන ස්ථානයට හිමි සම්මානයද අත්කර ගනිමිනි. ඉනික්බිතිව රජරට රයිෆල් බලකායේ ඛණ්ඩ භාර නිලධාරීවරයකු ලෙස රාජකාරී කටයුතු භාරගත් මොහුට එම බලකාය හා විජයබාහු රෙජිමේන්තුව ඒකාබද්ධ කර පිහිට වූ පළමුවන ගජබා රෙජිමේන්තුවේ කණ්ඩායම් භාර නිලධාරියකු ලෙස ක්‍රියා කිරීමට අවස්ථාව උදා විය.

මෙම වකවානුව තුළ මහා පරිමාණයේ හමුදා ක්‍රියාන්විතයන්ට අමතරව ත්‍රස්තවාදීන්ගේ ගරිල්ලා ප්‍රහාරයන්ට මුහුණ දීම පිණිස නව මාදිලියේ සටන් ක්‍රමයක් නිර්මාණය කළ යුතුය යන සංකල්පය ප්‍රථම වරට 1985 දී ඉදිරිපත් කරනු ලැබූ අතර, 1985 වසරේදී ගනේමුල්ල කමාන්ඩෝ පුහුණු පාසලේදී නිලධාරීන් දෙදෙනකු හා සෙබළුන් 38 දෙනෙකුගෙන් යුත් විශේෂ ප්‍රහාරක කණ්ඩායමේ පුහුණුවීම් ඇරඹිණි. 1985 දෙසැම්බර් මස පුහුණුව අවසන් කළ මෙම විශේෂ කණ්ඩායම සිය ප්‍රථම මෙහෙයුම් වැලිඔය හා කෝකිලායි ප්‍රදේශයන්හි දියත් කළේය. කොටි ත්‍රස්තවාදීන්ගේ බලකොටු බවට පත්ව තිබුණු මෙම ප්‍රදේශවල ත්‍රස්ත ක්‍රියාකාරකම් අඩපණ කර හමුදා මෙහෙයුම්වලට අවශ්‍ය පසුබිම සැකසීම මෙම කණ්ඩායමට පැවරුණු ප්‍රධාන වගකීම විය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් දියත් වූ මෙම කුඩා කණ්ඩායම් මෙහෙයුම් පිටුපස සිටි මහා මොළකරුවකු බවට ලුතිනන් ෆස්ලි ලෆිර් පත්විය. හමුදා මෙහෙයුමකදී එතෙක් අනුගමනය කළ සාම්ප්‍රදායික ප්‍රහාරක සැලසුම් වලට සපුරාම වෙනස් වූ ක්‍රමයක් මෙම කුඩා කණ්ඩායම් ප්‍රහාර තුළ විය. මෙහි ප්‍රමුඛතම ලක්ෂණය වූයේ නිරීක්ෂණයයි. ආරක්ෂක වළල්ලෙන් සැතපුම් ගණනාවක් එපිටට ගොස් දින කිහිපයක් මුළුල්ලේ සතුරාගෙන් වසන් වී ලබාගන්නා දත්ත හා තොරතුරු මත ප්‍රහාර සැලසුම් කෙරිණි. එමෙන්ම, සතුරා පසුපස හඹාගොස් පහර දී සතුරා විනාශ කිරීමෙහිලා මෙම කණ්ඩායම සතු වූ විශේෂ හැකියාව අනුව ඔවුන් සංග්‍රාමික ලුහුබැඳීමේ කණ්ඩායම හෙවත් *Combat Tracker Team* යනුවෙන් යුද්ධ හමුදාව තුළ හැඳින්විය.

මෙසේ ඉතා සියුම් ලෙස සැලසුම්කර දියත් කළ කුඩා කණ්ඩායම් ප්‍රහාර අති සාර්ථක ප්‍රතිඵල අත්කර දුන්නේය. උන්හිටි ගමන් ත්‍රස්තවාදී නායකයන්ගේ මළසිරුරු ඔවුන්ගේ පාලනයට නතුව තිබූ ප්‍රදේශයන්හි වන ලැහැබ් තුළ දක්නට ලැබීමෙන් කොටි නායකයෝ බියෙන් ඇලළී ගියහ. ඔවුහු මෙම ප්‍රහාරයන් අභ්‍යන්තර කැරැල්ලක ප්‍රතිඵල ලෙස විශ්වාස කළහ. යුද්ධ හමුදාවේ සෙසු ඒකකයන්ට මහත් උත්තේජනයක් අත්කර දුන් මෙම ප්‍රහාර හේතුවෙන් *Combat Tracker Team* නමින් හැඳින්වූ කණ්ඩායම ක්ෂණික විහිදුම් බලකාය හෙවත් *Rapid Deployment Force (RDF)* යන නාමයෙන් හඳුන්වන ලදී.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වය මනාව හසුරුවනු ලැබූ ලෆිර් ඉතා නිහතමානී සහ යුද්ධයට උපන් ශූර සෙබළකු ලෙස සමකාලීනයන් අතර ඉහළම මට්ටමක පැවති හමුදා විනය, උකුස්සකුගේ බඳු තියුණු නිරීක්ෂණ ශක්තිය, බුද්ධි අංශ තොරතුරු මැනවින් විශ්ලේෂණය කර නිගමනවලට එළඹීමේ සියුම් ඥානය, පොතපත පරිශීලනය කිරීමෙන් ප්‍රගුණ කරගත් දැනුම හා අවබෝධය යන කරුණු ඔහු විසින් ම මෙහෙයවන ලද ක්‍රියාන්විතවල ජයග්‍රහණයට තුඩුදුන් ප්‍රධාන සාධක විය.

1989 වර්ෂයේ යාපනය කොටුව ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදාගැනීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙම මෙහෙයුම තුළදී විශේෂ බලකාය වෙත විශේෂිත වූ මෙහෙයුම් රාශියක් පැවරිණ. මෙම රාජකාරී සඳහා ක්‍රියාකාරී ලෙස දායකවෙමින් මේජර් ෆස්ලි ලෆිර් ලබාදුන් දායකත්වය සමස්ත ක්‍රියාන්විතයම සාර්ථක කරගැනීමට මනා පිටුවහලක් වූ බැව් නොරහසකි. මෙවැනි වීර ක්‍රියාවන් හේතුවෙන් මේජර් ෆස්ලි ලෆිර් හට කිහිප වරක් රණ වික්‍රම පදක්කම හා රණ ශූර පදක්කම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෙන්ම සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක විසින් ප්‍රදානය කරන ලදී.

අධ්‍යාපන මාවතේ ඈතට ගමන්කර ඉංජිනේරුවරයකු බවට පත්ව මෙරට හෝ පිටරටක වරප්‍රසාද ලත් ජීවිතයක් ගතකිරීමේ සියලු මංපෙත් විවරව තිබුණද අස්ලම් ෆස්ලි ලෆිර් තෝරා ගත්තේ මව්බිමට උදාර මෙහෙවරක් ඉටු කළ හැකි අභියෝගාත්මක ගමන් මඟකි. උපන් බිමටත් තමා බිහිකළ දෙමාපියන්ටත් තම ආදරණීය සොයුරු සොයුරියන්ටත් ඔහු සදාකාලික කීර්තියක් අත්පත් කර දුන්නේය. කඩවසම් යෞවනයකු වූ මේජර් ෆස්ලි ලෆිර් වෙත තරුණියන්ගේ ආකර්ෂණය නොඅඩුව ලැබෙන්නට ඇත. එහෙත් ඔහුගේ සිත් තුළ නවාතැන් ගැනීමට භාග්‍යය උදා වූයේ එක් යෞවනියකටය. ඇය නමින් අනෝමා වික්‍රමසූරියයි. 1992 ජූනි මස 16 වන දින අතිනත ගත් ෆස්ලි හා අනෝමා තමන්ගේම නිවසක් තුළ තම යුග දිවිය ඇරඹූහ. ඔහු ඇයට සෙනෙහෙබර ස්වාමියකු විය. ඇයද ඔහු හට දයාබර බිරිඳක් වූවාය.

"අධිෂ්ඨානයෙන් අභීතව අරමුණ කරා" ගමන් කරන වීරෝදාර රණ ශූරයන් පිරිසකට අවශ්‍ය සටන් ශිල්ප ක්‍රම පිළිබඳ පන්නරය ලබා දීමේදී විශේෂ බලකා පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක වශයෙන් කටයුතු කරමින් මේජර් ලෆිර් ඉටු කළේ අනුපමේය මෙහෙවරකි. යාපනය අර්ධද්වීපය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදා ගැනීම සඳහා රිවිරැස ක්‍රියාන්විතය දියත් කිරීමට ප්‍රථම සියලුම යුද්ධ හමුදා පාබල ඒකක වෙත නගරබද සටන් පිළිබඳ විශේෂිත වූ පුහුණුවක් මෙම රණකාමී උපදේශකයාගේ මූලිකත්වයෙන් මාදුරුඔය හිදී ලබා දුන්නේය. ඉක්බිති 1995 පෙබරවාරි 28 වන දින සිට 1996 ජූලි 19 වන දින දක්වා කාලය තුළ පළමුවන රෙජිමේන්තුව විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලෙස කටයුතු කරමින් ඔහු විශේෂ බලකායේ අභිමානය තව තවත් ඔප්නැංවීය. වඩමාරච්චි, අසක සේනා, ත්‍රිවිධ බලය, සී බ්‍රීස්, රිවිරැස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ත්‍රස්තයන්ට එරෙහිව ක්‍රියාත්මක කළ සුවිශේෂී මෙහෙයුම් වේ. එහිදී මේජර් ලෆිර්ගේ නායකත්වය හා කැපකිරීම පළමුවන රෙජිමේන්තුව විශේෂ බලකායේ නාමය රණකාමී ඒකකයක් ලෙස බැබලවීමට හේතුවිය. රුදුරු ත්‍රස්තවාදී උවදුරෙන් මව්බිම මුදාගැනීමේ උදාර චේතනාවෙන් හමුදා ක්‍රියාන්විතවලදී විශේෂ බලකාය විසින් ඉටුකරනු ලැබූ අභිමානවත් මෙහෙවරට හිමිවිය යුතු ගෞරවයෙන් වැඩි කොටසක් ලුතිනන් කර්නල් අස්ලම් ෆස්ලි ලෆිර්ට හිමිය.

1996 ජූලි මස 18 වන දින වන්නි ප්‍රදේශයේ ප්‍රමුඛ පෙළේ හමුදා කඳවුරක් වන මුලතිව් කඳවුරට තම සියලු ශක්තිය එක්තැන් කර දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළ එල්ටීටීඊ ත්‍රස්තවාදීහු එහි රැඳී සිටි 1,200 ක් පමණ යුද්ධ හමුදා සෙබළුන් තම ග්‍රහණයට නතුකර ගත් අතර, ඔවුන් ගෙන් අප සෙබළුන් මුදා ගැනීම ආරක්ෂක හමුදා හමුවේ පැන නැගුණු බරපතලම අභියෝගයක් විය. මන්ද, මෙම කඳවුර වන්නි සටන් භූමියේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් වූ බැවිනි.

මුලතිව් කඳවුරට ආසන්නම කඳවුර කිලෝමීටර් 27 ක් දකුණින් පිහිටි වැලිඔය හමුදා කඳවුර විය. මුලතිව් කඳවුරෙහි සියලුම පාලන අවශ්‍යතාවයන් මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලැබිය. කඳවුරු ආරක්ෂාවට අවැසි කාලතුවක්කු වෙඩි බලය කඳවුරු තුළ ස්ථානගත කර මි.මී 122 කාලතුවක්කු වලින් ලබාදුන් අතර, එයද ත්‍රස්තවාදීන් අතට පත්වීමෙන් වැලිඔය කඳවුරේ ස්ථානගත කර තිබූ මි.මී 130 කාලතුවක්කු මගින් අවශ්‍ය වෙඩි බලය ලබාදෙන ලදී.

එයද උපරිම දුර සීමාවේ රඳවා තිබිණ. මුලතිව් කඳවුර හා

තිබුණු සියලුම ගුවන් විදුලි පණිවුඩ සම්බන්ධතා බිඳවැටී තිබුණු අතර, කඳවුරෙහි වත්මන් තත්වය දැන ගැනීමට හැකියාවක් නොමැති විය. මෙම අභියෝගයන් හමුවේ ගොඩබිම, මහ සයුර හා ගුවනෙහි දස්කම් දැක්විය හැකි විශේෂ බළකාය වෙත ආරක්ෂක ප්‍රධානීන්ගේ අවධානය යොමුවිය. එසැණින්ම ත්‍රස්තවාදීන් හට දිගින් දිගටම ප්‍රබල ලෙස අභියෝග කළ විශේෂ බලකා රණවිරුවකු වෙත ඔවුන්ගේ අවධානය යොමුවිය. ඒ අනෙකෙකු නොව පළමුවන විශේෂ බළකායේ අණදෙන නිලධාරී වූ ලුතිනන් කර්නල් ෆස්ලි ලෆිර්ය.

ලුතිනන් කර්නල් ෆස්ලි ලෆිර් මෙම අභියෝගය භාරගත්තේ කිසිදු පැකිළීමකින් තොරවය. එහෙත් ආධාරක වෙඩි බලයක් සහ ගුවන් විදුලි සම්බන්ධතාවක් නොමැතිව ගොඩබිම හා මුහුදු මාර්ගය ද කොටි ත්‍රස්තවාදීන් විසින් අවහිර කර ඇති අවස්ථාවක මෙන්ම යුද්ධ හමුදා සෙබළුන් 1,200 ක බලසේනාවක් සහිත කඳවුරක් ආක්‍රමණය කළ ත්‍රස්තවාදීන් හට එක් බලඇණියකින් ප්‍රහාර එල්ලකර කඳවුර හා සෙබළුන් මුදාගැනීම කොතරම් බැරෑරුම් දැයි ඔහුට නොදැණුනා නොවේ. ක්‍රියාන්විතය "ත්‍රිවිධ පහර" නමින් නම් කෙරිණ. යුද ශිල්පයෙහි අග තැන්පත් විශේෂ බලකා සාමාජිකයන් 275 ක් මෙම සුවිශේෂී මෙහෙයුම සඳහා සූදානම් කෙරිණි. "අපේම සහෝදර සෙබළුන් 1,200 ක් මුලතිව් කඳවුරේ ත්‍රස්තවාදීන් හා සටනක යෙදී සිටිනවා. අපි මොහොතක් හෝ පමා වුවහොත් ඒ වටිනා ජීවිත සියල්ල වියරු ත්‍රස්තවාදීන් විසින් විනාශ කරාවි. අපි විශේෂ බලකායට බැඳුණේ ස්වේච්ඡාවෙන්, ක්‍රියාන්විත සඳහා දායක වන්නේ අපි අපේ ස්වේච්ඡාවෙන්, ඒ අපි ගතින් මෙන්ම මනසින්ද විශිෂ්ටයින් වන හෙයිනි. දැන් අපිට අවස්ථාව එළඹ ඇත. අපි අපේ පූර්ණ ශක්තිය යොදා ත්‍රස්තවාදීන් විනාශකර මුලතිව් හි අපේම සෙබළුන් මුදාගත යුතුය. එක් සෙබළෙකු හෝ ත්‍රස්තවාදීන්ගේ අතට පත්වීමට ඉඩ නොතැබිය යුතුය. අධිෂ්ඨානයෙන් අභීතව අපි අරමුණ කරා යන්නෙමු." මේ පළමු වන රෙජිමේන්තුව විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කරනල් ෆස්ලි ලෆිර් සිය විශේෂ බලකා සාමාජිකයන් අමතා ක්‍රියාන්විතයට ප්‍රථම කරන ලද ප්‍රකාශයයි. එම ප්‍රකාශයෙහි බැරෑරුම් බව අධිෂ්ඨානශීලී බව සියලු විශේෂ බලකා සාමාජිකයන්ගේ මනසට තදින් කා වැදුණි.

මුලතිව් බලා පියාසර කිරීමට සූදානම් කර තිබුණු ගුවන් හමුදාවට අයත් එම් අයි 17 හෙලිකොප්ටර් යානා, කෆීර් හා එම් අයි 24 හෙලිකොප්ටර් යානා පොදු අරමුණක් උදෙසා ගුවන්ගත වෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ තවත් වික්‍රමාන්විත මෙහෙයුමක ප්‍රථම පියවර ඇරඹිණි.

සටනේ තියුණු අවස්ථාවන් හිඳී ගොඩින්, දියෙන් හෝ ගුවනින් රණබිමට අවතීර්ණ වීමට සපථව ඇති විශේෂ බලකා සාමාජිකයෝ බැරෑරුම් ක්‍රියාන්විතයකට සිතින් මෙන්ම ගතින්ද සූදානම් වූහ. කොටින්ම කොටින්ගේ වෙඩි වරුසා හෙලපිකොප්ටර් ආක්‍රමණය කරද්දී සටනෙහි දරුණු අවස්ථාවේදී තීරණ ගන්නා යුද සෙනෙවියකු ලෙස ලුතිනන් කර්නල් ෆස්ලි ලෆිර් ද තමා සිටි ගුවන් යානයේ නියමුවන් සහ කාර්ය මණ්ඩලයට ද නායකත්වය දෙමින් ඔවුන් ද තම විධානයට නතුකර ගනිමින් ගුවනේ සිටම ප්‍රහාර එල්ල කර හී සැරයක් ලෙසින් ත්‍රස්තවාදීන්ගේ බර අවි ස්ථානගත කර තිබුණු ස්ථානයටම තම හෙලිකොප්ටර් යානා බැස්සවීමට කටයුතු කළේය. හෙලිකොප්ටර් යානා ත්‍රස්තවාදීන් එල්ල කරන ලද වෙඩි ප්‍රහාරවලට ලක්වුවද එහි සිටම ත්‍රස්වාදීන් හට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කිරීමට විශේෂ බලකා සාමාජිකයෝ ක්‍රියා කළහ. හෙලිකොප්ටර් තුළදීම විශේෂ බලකා සාමාජිකයන් කිහිප දෙනෙකු හට තුවාල සිදු වුවද එම් අයි 24 හෙලිකොප්ටර් ආධාරයෙන් ආධාරක වෙඩි බලය සමඟ එම් අයි 17 යානා 04 ක් සතුරු භූමියට ගොඩ බැස්ස වූයේ සතුරා විශ්මයට පත්කරමිනි. ගුවනේ සිට එල්ල කළ ප්‍රහාරයන්ගෙන් සතුරු ගුවන් යානා නාශක අවි කිහිපයක් අකර්මණ්‍ය කිරීමට වීරෝදාර විශේෂ බලකා සාමාජිකයෝ සමත් වූහ. හෙලිකොප්ටර්වලින් බිමට බසින ලද ලුතිනන් කර්නල් ෆස්ලි ලෆිර් ඇතුළු කණ්ඩායමට ත්‍රස්තවාදීන්ගේ දරුණු ප්‍රහාරවලට මුහුණ දීමට සිදුවිය. ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් එක් හෙලිකොප්ටරයක සිටි විශේෂ බලකා සාමාජිකයන් හට ගොඩබිමට අවතීර්ණ වීමට නොහැකි වූ අතර, එහි අඩුවද තමා සමඟ සිටි හටපිරිස් තුළින්ම පිරිමසා ගැනීමට අණදෙන නිලධාරී හට සිදුවිය. ගුවන්විදුලි සම්බන්ධතා වල දුර්වලතා හේතුවෙන් අවැසි වේලාවට අවැසි ස්ථානයට ගුවන් ප්‍රහාර එල්ල කිරීම දුෂ්කර විය. වැලිඔය ස්ථානගත කර තිබූ කාලතුවක්කු මගින් ලබා ගන්නා ලද වෙඩි බලය උපරිම දුර සීමාව හේතුවෙන් ප්‍රතිඵල රහිත විය. මේ සියල්ලෙන් ප්‍රයෝජන ගත් ත්‍රස්තවාදීහු මුහුදු රළ මෙන් එකිනෙකා පරයමින් ලුතිනන් කර්නල් ලෆිර් ඇතුළු කණ්ඩායම වෙත ප්‍රහාර මාලාවක් එල්ල කළහ. එහිදී විශේෂ බලකා සාමාජිකයන් කිහිප දෙනෙකු තම දිවි මව්බිම වෙනුවෙන් පුද කළහ. එසේම සැලකිය යුතු සංඛ්‍යාවක් සටන ආරම්භයේම තුවාල ලැබූහ. එහෙත් එයින් අධෛර්යය නොවූ මේ වීර සෙන්පතියා තම සෙබළුන් දිරි ගන්වමින් සතුරාට ප්‍රහාර එල්ල කර යම්තාක් දුරට භූමියේ අණසක තමා යටතට ගැනීමට සමත්විය. පැය කිහිපයක සටන දින කිහිපයක සටනක මුහුණුවරක් ගත්තේය. එය එතරම් බිහිසුණුය. මෙහි බිහිසුණු බව අඳුර වැටෙත්ම සෙබළ බලමුළුවලට වඩ වඩාත් දැනෙන්නට විය. එදින රාත්‍රිය පහන්වන විට ත්‍රස්තවාදීන් විසින් සියලු ප්‍රයත්න යොදා විශේෂ බලකා සාමාජිකයන් විනාශ කිරීමට උත්සාහ දරන ලදී.

වෙඩි හඬින් මුලතිව් ප්‍රදේශයම රාත්‍රිය පුරාවට ගිගුම් දුන්නේය. ත්‍රස්ත ප්‍රහාර මධ්‍යයේ කළුවරේ වුවද ලුතිනන් කර්නල් ලෆිර් එක් එක් විශේෂ බලකා සාමාජිකයා ළඟට යමින් පැවරී ඇති කාර්යයයේ බැරෑරුම්භාවය වටහා දෙමින් ඔවුන්ව ධෛර්යවත් කළේය. එමෙන්ම, දරුණු ලෙස තුවාල වූ සියලු සගයන් හට ලබාදෙන මූලික ප්‍රතිකාර ද ලබාදෙමින් ගුවන් යානයක් පැමිණෙන තෙක් ඔවුන් ජීවත් කරවීමට ක්‍රියා කළේ පියකු තම දරුවන් රැකබලා ගන්නා ආකාරයෙනි. තම නායකයාගේ මෙම ක්‍රියාවන් දෙස බලා සිටි විශේෂ බලකා සාමාජිකයන්ට මෙවැනි නායකයකු යටතේ ක්‍රියා කර මිය ගියද කම් නැතැයි සිතිණ. බිහිසුණු රැයක් පහන් විය. එහෙත් විශේෂ බලකා සාමාජිකයන්ට එල්ල වන ත්‍රස්තවාදී ප්‍රහාරවල අඩුවක් නොවීය.

නිදි වර්ජිතව ක්‍රියා කළ මෙම සුවිශේෂී වූ සෙනෙවියා ඔහුගේ අභිප්‍රාය වූ මුලතිව් කඳවුර හා එහි සිටින හමුදා සාමාජිකයන් බේරාගැනීමේ ක්‍රියාන්විතයේ ඊළඟ අදියර ක්‍රියාත්මක කළහ. සතුරු ප්‍රහාර මැද මුලතිව් කඳවුර වෙතට ගමන් කිරීමට ගන්නා ලද ප්‍රයත්නය තේරුම් ගත් ත්‍රස්තවාදීහු ඔවුන්ගේ ප්‍රහාර තීව්‍ර කරන්නට වූහ. ප්‍රහාර මර්දනයේදී සැලකිය යුතු ත්‍රස්තයන් ප්‍රමාණයක් මියගියද ඉන් විශේෂ බලකා සාමාජිකයන් හටද දැඩි හානි සිදුවිය. දවස පුරාවටම එම ස්ථානයේ සිටම සටන මෙහෙය වීමට අණදෙන නිලධාරී හට සිදුවිය. රාත්‍රිය උදාවිය. කිසිවකු හට ආහාර ගත් බවක් හෝ නොගත් බවක් මතක නැත. එම රාත්‍රියද පෙර රාත්‍රිය මෙන් භයානක විය. එහෙත් යුද ශිල්පයේ හසල දැනුමක් ඇති යුද්ධයේ දරුණු

අවස්ථාවන් හට මුහුණ දී ඇති ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් හට නම් එය අභියෝගයක් නොවීය. ඒ බව එවකට පළමු වන විශේෂ බලකායේ ජී බලසනයේ බලසනාධිපතිව සිටි මේජර් ජයන්ත රත්නායක හට පවසන ලද දෙයින් මනාවට පැහැදිලි වේ. එනම්, ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් ගේ අදහසට අනුව එදින රාත්‍රිය ඔහු යුද හුමියේ මෙතෙක් ගෙවන හොඳම හා ප්‍රබලම රාත්‍රියයි. මධ්‍යම රාත්‍රිය උදාවත්ම ත්‍රස්ත ප්‍රහාර ප්‍රබල විය. කෙසේ වුවද ත්‍රස්තවාදීන් හා සටනට පැමිණ ඇත්තේ විශේෂ බලකාය බව ත්‍රස්තවාදීන්ට ඒත්තු ගැන්වී හමාරය. එමෙන්ම, විශේෂ බලකා නායකත්වය පිළිබඳව මනා වැටහීමක් ත්‍රස්තවාදීන්ට තිබෙන්නට ඇත. විශේෂ බලකා සාමාජිකයින්ට මුහුණ දීමේ අසීරුතාවය තේරුම් ගත් ත්‍රස්තවාදී නායකයෝ සැලසුම් වෙනස් කරමින් කෙසේ හෝ ලුතිනන් කර්නල් ලෆීර් ඇතුළු විශේෂ බලකා කණ්ඩායම සටන් බිමෙන් ඉවත් කිරීමට ප්‍රහාරයක් දියත් කරන්නට වූහ. සටන්බිමේ සිංහරාජයකු මෙන් තම සගයන් මෙහෙය වූ ලෆීර් සෙනෙවියාට සිව් දෙසින් වෙඩි ප්‍රහාර එල්ල කරන ලෙස ත්‍රස්තවාදී නායකයෝ උපදෙස් දුන්නෝය. ඒ අනුව ගොඩබිමෙන් පමණක් නොව මුහුදේ සිටි මුහුදු කොටින් විසින්ද හට පිරිස් වෙත බර අවි යොදා ප්‍රහාර එල්ල කරන ලදී. උපක්‍රමශීලීව එම ප්‍රහාරයන්ගෙන් මිදෙමින් සටන මෙහෙයවද්දී තම සාමාජිකයන් තුවාල ලැබුවද ලුතිනන් කර්නල් ලෆීර් හෝ සෙසු රණවිරුවන් පසුබැස්සවීමට ත්‍රස්තවාදීන්ට හැකි නොවීය. තමා සටන් කරන්නේ කුඩා කණ්ඩායමක් සමඟ වුවද සටනින් තමන්ට අවාසි වන බව දැනුණු විට ත්‍රස්තවාදීන්ගේ ඊළඟ පියවර වශයෙන් මරාගෙන මැරෙන සාමාජිකයෝ ද සටන් බිමට අවතීර්ණ කරනු ලැබූහ. ලුතිනන් කර්නල් ලෆීර් ත්‍රස්තවාදීන්ගේ මෙම උපක්‍රමය කල් ඇතුව අවබෝධ කරගෙන සිටියේය.

විශේෂ බලකා සෙබළ සංකල්පය ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් ඇතුළු සාමාජිකයන්ගේ දෙසවන් තුළ රැව් පිළිරැව් දෙන්නට විය. "නිර්භීතකම පෙරදැරි කරගත් මා මගේ පූර්ණ ශක්තිය යොදා රණබිමේදී සතුරා විනාශ කරමි. කිසිවිටෙකත් සතුරාට යටත් නොවන මා තුවාල ලත් සහෝදර සෙබළුන් සතුරා අතට පත්වීමට ඉඩ නොතබමි. එමෙන්ම කිසිම අවස්ථාවකදී විශේෂ බලකාය අවමානයට පත්වන අයුරින් ක්‍රියා නොකරමි. සටනේ තනිවුවත් අරමුණ සම්පූර්ණ වන තෙක් විශේෂ බලකා සෙබළකු ලෙස තනිව හෝ සටන් කිරීමට මා තුළ ඇති හැකියාව නිරතුරුවම පෙන්නුම් කරමි" එවැනි වූ අධිෂ්ඨාන ශක්තියකින් යුතුව සටන මෙහෙයවමින් සිටි මේ මහා සෙන්පතියා සැලකිය යුතු ත්‍රස්තවාදීන් ප්‍රමාණයක් විනාශ කිරීමට සමත් විය. ත්‍රස්තවාදීහුද තමන් සතු සියලු ශක්තිය යොදා මෙම නායකත්වය විනාශ කර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මුලතිව් කඳවුර නැවත අත්පත්කර ගැනීමේ ප්‍රයත්නය ව්‍යර්ථ කිරීමට වෑයම් කළහ. ත්‍රස්තවාදීහු විශේෂ බලකා සාමාජිකයන් සිටි එක් ස්ථානයක් බලා දැඩි ප්‍රහාර එල්ල කර එම ස්ථානය අල්ලා ගෙන එතැන් සිට ඉදිරි ප්‍රහාර ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළහ. ඔවුන්ගේ උපක්‍රමය මැනවින් වටහාගැනීමේ තීක්ෂණ බුද්ධියක් හිමි ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් යුහුසුලුව ක්‍රියාකර වෙනත් කණ්ඩායමක් යොදා සතුරාට දැඩි ප්‍රහාරයක් එල්ල කළේය. එම ප්‍රහාරය නොවන්නට සතුරාගේ බලාපොරොත්තු සඵල වීමට ඉඩ තිබිණ. මෙම ක්‍රියාවන් පෞද්ගලික අභිමානය දනවන්නට නොව හුදෙක්ම 1,200 ක් පමණ වූ සහෝදර සෙබළුන්ගේ ජීවිත බේරාගැනීම උදෙසා කරන ලද නිර්භීත ක්‍රියාවන්ය. ඔහුගේ සිත කය දෙකම වේගයෙන් ක්‍රියාත්මක වෙමින් තිබිණ. තමාගේ බණ්ඩයට බරපතළ හානි වුවද ජයග්‍රහණයේ ස්ථිර බව සතුරාට වී ඇති හානිය අනුව ඔහුට දැනිණ. දින 02 ක් ආධාර භටපිරිස් නොමැතිව ආධාර වෙඩි බල නොමැතිව තමා රැගෙන ආ වෙඩිද්‍රව්‍ය මතම රැඳෙමින් ත්‍රස්තවාදීන්ට ඇති කළා වූ බරපතළ හානිය අනුව තමා හෝ තමාගේ බණ්ඩය ත්‍රස්තවාදීන්ට විනාශ කළ නොහැකි බව ඔහුට ඒත්තු ගියේය. ඒ සමගම මුලතිව් කඳවුර බේරාගැනීමේ බලාපොරොත්තුවේ හැඟීම ඔහුගේ ඇඟ පුරා දිවයන්නට විය. දහවල් වන විට ත්‍රස්තවාදී ප්‍රහාරයන් තීව්‍ර වූ අතර, එයින් බොහෝමයක් නායකත්වය ඉලක්ක කරන ලද ප්‍රහාර විය. ප්‍රහාර අතරතුරදී නායකත්වය විනාශ කරනු වස් යොදවා තිබූ එල්ටීටීඊ ත්‍රස්තයෙකුගේ ඉලක්කය ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් වෙත යොමුවිය. ගුවන්විදුලි යන්ත්‍ර කිහිපය වට කොට ගත් පළමුවන විශේෂ බලකා අණදෙන නිලධාරී සිටි තැන ත්‍රස්තවාදියාට පැහැදිලි ඉලක්කයක් වූයේය. ගතවූයේ නිමේෂයකි. ගිනියම් වූ උණ්ඩයක් මේ මහා සෙනෙවියාගේ ළය හරහා ගමන් කළේය. අවාසනාවකි, එය මාරාන්තික තුවාලයකි.

එහෙත්, එම උණ්ඩයෙන් දෙනෙත් පියාගන්නට මේ අභීත සෙන්පතියාට සිත් දුන්නේ නැත. තුවාලයෙන් ගැලුවා වූ රුධිර ගංගා හේතුවෙන් තම ජීවය හැරයන තෙක් තම විශේෂ බලකා සාමාජිකයන්ට නායකත්වය ලබාදීමට පළමුවන විශේෂ බලකායේ අණදෙන නිලධාරී වූ ලුතිනන් කර්නල් ෆස්ලි ලෆීර් ක්‍රියාකළේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම රණකාමියෙක් බව සපථ කරවමිනි. ඒ අභීත බුද්ධිමත් රණකාමියාගේ අවසන් සුසුම් විශ්වයට මුසු වූ ඒ ඓතිහාසික දවස යුද්ධ හමුදා ඉතිහාසයේ සනිටුහන් වී ඇත්තේ 1996 ජූලි මස 19 වන දා ලෙසයි. අස්ලම් ෆස්ලි ලෆීර් යනු අසමසම මානුෂික ගුණයෙන් සමන්විත කරුණාබර හදවතක් ඇති පුද්ගලයෙකි. ඔහුගේ නායකත්වය සෑමවිටම අන් අයට ආදර්ශයක් විය. ඔහු කිසි විටෙකත් ආයතන ප්‍රධානියකු නොව නායකයෙකි. මනා පෞරුෂයකින් හෙබි ෆස්ලි ලෆීර් සෑමවිටම අන් අයගේ සිත් දිනා ගත්තේය. ඒ සමඟම ඔහු උපතින් වාසනාව ගෙනා අයෙකි. ඔහු අද සිටියා නම් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මනා පෞරුෂයකින් හෙබි ජෙනරාල්වරයකු වනවා නොඅනුමානය. එදා දවස සොළීන්ට විරුද්ධව සටන මෙහෙය වූ දස මහා යෝධයන් මෙන් වත්මනෙහි එල්ටීටීඊ ත්‍රස්තවාදය ශ්‍රී ලංකා මාතෘ භූමියෙන් මුලිනුපුටා දැමීමට ක්‍රියා කළ පතාක යෝධයන් අතරට කර්නල් අස්ලම් ෆස්ලි ලෆීර් යන නාමය ලියවෙනවාමය.

සතුරු උණ්ඩය ළය පසාරු කරගෙන ගියද අවසන් සුසුම වාතලයට එක්වෙන තෙක් සටන අත්නොහැරි මෙම රණකාමියා හට නිලධාරියකු තම ජීවිත පරිත්‍යාගයෙන් අන් අයගේ ජීවිත බේරා ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් පුද්ගලිකව කරනු ලබන්නාවූ වීර ක්‍රියාවන් උදෙසා ලබාදෙන්නා වූ උත්තම සම්මානය වන පරම වීර විභූෂණයෙන් පිදුම් ලද්දේය.

එම උත්තරීතර වූ පරම වීර විභූෂණය 2001 වර්ෂයේ අප්‍රේල් 24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනිය සහ සන්නද්ධ සේනාවන්හි සේනාධිනායිකා අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මෙම අභීත සෙන්පතියාගේ ආදරණීය බිරිඳ වන අනෝමා වික්‍රමසූරිය මැතිනිය වෙත ප්‍රදානය කරන ලදී.



යුද්ධ හමුදා මූලස්ථානය විසින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.

# සුබ මොහොතින් ගෞරවනීය තනතුරු ලද වගයි



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ලෙස මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය දෙසැම්බර් 17 වන දිනට යෙදුණු සුබ මොහොතින් වැඩ භාරගන්නා ලදී. එහිදී නව ආඥාපතිට හමුදා සම්ප්‍රදායානුකූලව හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි.



ආරක්ෂ සේනා (නැගෙනහිර) නව ආඥාපති ලෙස මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය දෙසැම්බර් 15 වන දිනට යෙදුණු සුබ මොහොතින් වැඩ භාරගන්නා ලදී. ආගමික වතාවත් මධ්‍යයේ පැවති වැඩ භාර ගැනීමේ අවස්ථාවට එම මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද එක් වූහ.



පනාගොඩ පිහිටි ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) නව ආඥාපති ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් දෙසැම්බර් 16 වන දින හමුදා සම්ප්‍රදායානුකූලව පැවති උත්සවයකදී ආගමික වතාවත් මධ්‍යයේ රාජකාරි ආරම්භ කළේය. නව ආඥාපති සිය පත්වීමට පෙර 11 වන සේනාංකයේ සේනාංකාධිපති ලෙස රාජකාරි ඉටුකළේය.

# හිසට සෙවණක් ලබා දෙමින්

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත ක්‍රියාත්මක "හිසට සෙවණක්" නිවාස වැඩසටහනෙහි අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස පිරිනැමීමේ තවත් එක් අදියරක් පසුගියදා ක්‍රියාවට නැගිණ. ඒ යටතේ කරෙයිනගර් ප්‍රදේශයේ පදිංචි තම්බිරාසා මතියලගන් සහ පුත්තූර් ප්‍රදේශයේ පදිංචි එස් සුරේෂ්කුමාර් යන අඩු ආදායම්ලාභී පවුල් දෙක වෙනුවෙන් අභිනවයෙන් ඉදිකරන ලද නිවාස 02 ක් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 27 වන දින එම පවුල් වෙත භාර දෙන ලදී.

513 වන සහ 522 වන පාබල බලසේනාවන්හි අධීක්ෂණය යටතේ 15 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවේ සහ 11 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් දානපති මොහාන් ශංකර් මහතා සහ එම මැතිනියගේ මූල්‍ය අනුග්‍රහය යටතේ මෙම නව නිවාස දෙකෙහි ඉදිකිරීම් කටයුතු සිදු කෙරිණ.





# නොමැකෙන දිනයක මතක සටහන්





ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ විදේශීය සාමාජිකයන් පිරිසක් ඉකුත් නොවැම්බර් 12 වන දින ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එම මූලස්ථානයේදී හමු වූහ.

මෙහිදී දැනට වන්නි බලප්‍රදේශයේ තත්වය, යුද්ධ හමුදාව විසින් සිදුකරන ලද සමාජීය සුබසාධන වැඩසටහන් සහ සිවිල් ජනතාව වෙත ලබාදෙන සහයෝග පිළිබඳ සාකච්ඡා කරන ලදී. අනතුරුව ආඥාපති විසින් එම නියෝජිතයන් වෙත සමරු තිළිණ ද ප්‍රදානය කරන ලදී.

# සංචාරයක මතක සටහන්





ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් දෙසැම්බර් 02 වන දින වව්නියාව ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථානවල සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී වව්නියාව බෝධිදක්ෂිණාරාමය, මඩුකන්ද ශ්‍රී දළදා විහාරය, ඇටඹගස්කඩ ශ්‍රී සුදර්ශනාරාම විහාරය යන ආගමික ස්ථාන වැඳපුදා ගැනීමෙන් අනතුරුව, මහා සංඝයා වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගන්නා ලදී.

# අඩු ආදායම්ලාභී පවුල් වෙත නව නිවාස ලබා දෙයි

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බල ප්‍රදේශයට අයත් විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන අම්පාර, පානම ප්‍රදේශයේ පදිංචි කේ මල්එතනා මහත්මිය සහ පොතුවිල් ප්‍රදේශයේ පදිංචි එම්.අයි. සිත්ති ෆාතිමා මහත්මිය වෙනුවෙන් ඉදි කළ නවත් නිවාස 02 ක් ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් පසුගියදා භාර දෙන ලදී.





ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ව්‍යාපෘතිය වෙතින් අමුද්‍රව්‍ය සඳහා ලබා දුන් ප්‍රතිපාදන ද අනුග්‍රාහක භවතුන්ගේ සහයෝගය ද මත 23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 8 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ශ්‍රම දායකත්වයෙන් මෙම නිවාසවල ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබූහ. මෙම අවස්ථාවට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්, 24 වන පාබල සේනාංකාධිපති, 242 වන පාබල බලසේනාධිපති, 23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 8 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරීන් මෙන්ම ප්‍රදේශවාසීන් පිරිසක් ද ඊට සහභාගී වූහ.

# සංචාරයක සටහන්





1 වන බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී 1 වන බළකාධිපති වශයෙන් වැඩ භාර ගැනීමෙන් පසු ඉකුත් නොවැම්බර් 05 වන දින 5 වන ගැමුණු හේවා බළකායේ සංචාරයක නිරත විය. මෙහිදී අණදෙන නිලධාරී ඇතුළු පිරිසගෙන් බළකාධිපති වෙත හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි. සිය සංචාරය තුළ බළකාධිපති විසින් එහි හටපිරිස් ඇමතීමටද අමතක නොකළේය. මෙම අවස්ථාව සඳහා 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ගුවන් සංග්‍රාමික බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ඉතිහාසය සුරකින්නට නව සෙවණක්





ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) විසුරුවා හැර 1 වන බළකාය ස්ථාපනය කිරීමෙන් පසු එම ආරක්ෂක සේනා මූලස්ථානය සිහිවනු වස් එහි තිබූ වැදගත් භාණ්ඩ එකතුකර කෞතුකාගාරයක් ස්ථාපිත කරන ලදී. එසේ ඉදි කළ කෞතුකාගාරය 1 වන බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී විසින් ඉකුත් දෙසැම්බර් 01 වන දින විවෘත කරන ලදී. 1 වන බළකාය, 9 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු සහ 11 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තු හට පිරිස් මෙම කෞතුකාගාරය ඉදි කිරීමට ශ්‍රම දායකත්වය ලබා දුන්හ.

# සේනාංක සචාරයකට එක්වෙමින්





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සිය ධූරයේ රාජකාරී ආරම්භ කිරීමෙන් අනතුරුව ඉකුත් නොවැම්බර් 29 වන දින 59 වන පාබල සේනාංකය සහ ඒ යටතේ ඇති පාබල බළසේනා, ඒකකයන්හි සංචාරයක නිරත වන ලදී.

එහිදී 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබංඩාර යූඑස්පී විසින් ආඥාපති උණුසුම් අයුරින් පිළිගත් අතර, එම අවස්ථාවට 591, 592 සහ 593 පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ. එහිදී ආඥාපති විසින් කඳවුරු පරිශ්‍රයේ රුක් රෝපණයක් සිදුකොට එහි හටපිරිස් ඇමතීම ද සිදු කරන ලදී. ඉන් අනතුරුව 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය, 24 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ 23 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකක නිරීක්ෂණයට ද හෙතෙම එක්විය.

# සෙසුනිල සුබසාධනයට නව සෙවණක්







ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවය කරන සෙබළුන්ගේ සුබසාධන කටයුතු තවදුරටත් ඉහළ නංවමින් ප්‍රතිසංස්කරණය කරන ලද හට නිවාසයක් බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ඉකුත් නොවැම්බර් 23 දින විවෘත කෙරිණ.

සනීපාරක්ෂක පහසුකම් සහිතව ඇඳන් 29 කින් සහ භෝජන ශාලාවකින් සමන්විත මෙම හට නිවාසය ඉදිකිරීම සඳහා 1 ඉංජිනේරු සේවා රෙජිමේන්තු හට පිරිස් සහ ආරක්ෂක සේනා ඉංජිනේරු හට පිරිස් ශ්‍රම දායකත්වය දැක්වූහ.

# රුධිර සංචිත ප්‍රතිපූරණයට යුද්ධ හමුදා සහාය





මඩකලපුව ශික්ෂණ රෝහලේ ලේ බැංකුවේ හිඟවෙමින් පැවති රුධිර සංචිත අවශ්‍යතාවය නැවත ප්‍රතිපූරණය කිරීම සඳහා 23 වන පාබල සේනාංකයට අයත් 231 වන පාබල බලසේනාව යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා හටපිරිස් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ. 231 වන පාබල බලසේනා මූලස්ථානයේදී පැවති එම ලේ දන්දීමේ වැඩසටහනේදී යුද්ධ හමුදා සාමාජිකයන් 95 දෙනකු සිය රුධිරය පරිත්‍යාග කළහ.

රෝහල් බලධාරීන්ගේ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් එහි වෛද්‍යවරු, හෙදියන් සහ වෛද්‍ය සහයකයන්ගේ සහයෝගය ඇතිව මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් දුලිප බණ්ඩාර ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සමන් දේව ප්‍රතිමාව හා දේව ආභරණ රණවිරු දෑත්වලින් වැඩම කෙරේ





ශ්‍රී පාද වන්දනා සමය ආරම්භ කරමින් නල්ලතන්නියේ සිට සධාතුක කරඬුව, සමන් දේව ප්‍රතිමාව, දේව ආභරණ හා පූජා භාණ්ඩ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් ශ්‍රී පාද මළුව දක්වා ඉකුත් දෙසැම්බර් 18 වන දින වැඩමවන ලදී. මෙම උතුම් පුණ්‍ය කටයුත්ත සඳහා 19 වන ජාතික ආරක්‍ෂක බලමුළුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් ශ්‍රම දායකත්වය දැක්වූහ. ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් ද මෙම උතුම් වූ පුණ්‍යමය කටයුත්තට එක්වූහ.

# අසරණ පවුලක් වෙත නව නිවසක්



121 වන බලසේනා බලප්‍රදේශයේ මොණරාගල වෙල්ලස්ස ප්‍රදේශයේ පදිංචි වයිඑම් ජයරත්න යන අය වෙනුවෙන් ඉදි කළ නව නිවසක් ඉකුත් නොවැම්බර් 15 වන දින ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණ. කතරගම මහා දේවාලයේ බස්නායක නිළමේ තුමන් විසින් මූල්‍ය දායකත්වය සපයන ලද මෙම නිවෙස ඉදිකිරීමට 121 වන පාබල බලසේනාවේ භට පිරිස් ශ්‍රම දායකත්වය සැපයූහ. අදාළ නිවස පරිත්‍යාග කිරීමේ අවස්ථාවට 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩී ප්‍රසන්න රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, 121 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීයූඑන් සේරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, කතරගම මහා දේවාලයේ බස්නායක නිළමේ වන ඩිල්ෂාන් ගුණසේකර මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගනිමු

**2020 සැප්තැම්බර් කලාපය හා සම්බන්ධවයි**

ස්ත්‍රියක් හා පුරුෂයකු නීත්‍යානුකූල විවාහ වීමත් සමඟ පවුලක් ගොඩනැගේ. පවුල් සංස්ථාවක් බවට පරිවර්තනය වීමට ඔවුන්ට දරුවන් ලැබිය යුතුය. එතැන් පටන් පවුලේ වගකීම් කාර්යභාරයන් එකිනෙකට වර්ධනය වේ. යහපත් ආකල්ප වලින් බිරිඳ සහ ස්වාමි පුරුෂයා එක වහලක් යට ජීවත්වීම තුළින් මෙම සංස්ථාව ක්‍රමවත්ව ගොඩනැගේ. එසේම අයහපත් ආකල්ප වලින් බිරිඳ සහ ස්වාමි පුරුෂයා කටයුතු කරන්නේ නම් එම පවුල් සංස්ථාව දෙදරා යාමද සිදුවිය හැකිය. සෑම විවාහක බිරිඳක් සහ ස්වාමි පුරුෂයෙක්ම සෑම විටම පවුලේ දියුණුව වෙනුවෙන් කටයුතු කිරීමට අමතක නොකළ යුතුය.

දෙමාපියන් යටතේ පෝෂණය වන දරුවන් හදා වඩා ගැනීමේදී සැලකිලිමත් විය යුතු බොහෝ කරුණු ඇත. ඒවා මොනවාද යන්න සලකා බලමු.

1. ආදරය හා ආරක්ෂාව
2. පෝෂණය
3. සෞඛ්‍ය
4. යහපත් ආකල්පවලට දරුවන් යොමු කිරීම
5. නිසි වයසේදී අධ්‍යාපනයට යොමු කිරීම
6. දරුවන්ගේ දක්ෂතා හඳුනා ගැනීම
7. වරදේ බැඳීම් තුළින් ගලවා ගැනීම
8. ආගමික පසුබිම පවරා දීම

## 1. ආදරය හා ආරක්ෂාව

මෙලොව එළිය දකින සියලුම සත්වයාට අවශ්‍යම දෙය දෙමාපිය ආදරය හා ආරක්ෂාවයි. එම ආරක්ෂාව හා ආදරය දරුවන්ට දැනෙන්නට, හැඟෙන්නට ලබාදීම දෙමාපිය වගකීමකි. දරුවාට ආදරය, කරුණාව නිසි පරිදි ලැබීම තුළින් දරුවාගේ අනාගත ක්‍රියාවලිය යහපත්ව සිදුවේ.

## 2. පෝෂණය

දරුවකුට මව්කිරි තරම් පෝෂ්‍යදායී ආහාරයක් කුඩා කාලයේ නොමැති හෙයින් මව්කිරි දරුවන්ට උපරිමය ලබාදීමට මව විසින් කටයුතු කළ යුතුය. ඒ තුළින් දරුවා නිරෝගිමත් සමාජයට වැඩදායී, යහපත් මානසික තත්වයකින් වැඩෙනු ඇත. නිසි පරිදි අවශ්‍ය කාලවේලාවට පෝෂණ කොටස් ලබාදීමට දෙමාපියන් කටයුතු කළ යුතුයි. වර්තමාන සමාජයේ මෑණියන් රැකියාවට යාම නිසා මව්කිරි ලබාදීම ගැටලුකාරී තත්වයක් බවට පත්ව ඇත. ඔබ රැකියාවක නිරත මවක් නම් ප්‍රාදේශීය පවුල් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය මුණගැසී අවශ්‍ය උපදෙස් නිසි පරිදි කළමනාකරණය කරගත යුතුය.

සෞඛ්‍ය තත්වය.

දරුවාගේ නිසි කලට නිසි වැඩ සැකසෙන්නේ සෞඛ්‍ය තත්වය යහපත් වූ විටය. එම නිසා දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳ දෙමාපියන් සහ වැඩිහිටියන් විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය.

## 3. යහපත් ආකල්ප වලින් පෝෂණය කිරීම

දෙමාපියන් තම දරුවන් යහපත් මාර්ගයේ ගමන් කරවීමට දැඩි උත්සාහයක් ගනු ඇත. නමුත් එම තත්වය ගොඩ නැගීමට පළමුව දෙමාපියන් ආදර්ශවත්ව තම ජීවිකාව ගොඩනැගිය

යුතුය. දෙමාපියන් යහපත් ආකල්පවලින් සංවර්ධිත වීමෙන් දරුවන්ද එම ආකල්පවලින්ම සන්නද්ධ කිරීමට අපහසු නොවනු ඇත.

## 4. නිසි වයසට අධ්‍යාපනයට යොමු කිරීම

දරුවන් පළමුව අධ්‍යාපනය ලබන්නේ තම නිවස කේන්ද්‍රස්ථානය කොට ගෙනය. දරුවන්ට අවශ්‍ය මූලික අධ්‍යාපනික සංකල්ප නිවස තුළින්ම ගොඩනගා ගැනීමට නිවෙසේ වැඩිහිටියන්ගේ දායකත්වය ලබාදිය යුතුමයි. දරුවකුට නිවෙස යනු පාසලක්, රෝහලක්, ක්‍රීඩා පිටියක්, විනෝදකාමී රඟමඩලක්, එසේම පූජනීය ස්ථානයක් වනු ඇත. එසේනම් දරුවන්ගේ මූලික අධ්‍යාපන පරිසරය නිවෙස තුළින් ලබාගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරදීම දෙමාපියන්ගේ කාර්යභාරයකි.

## 5. දරුවන්ගේ දක්ෂතා හඳුනාගැනීම

"ලොවෙන් එකක් එක් දෙයකට වෙයි සමතා" මෙම කියමනට අනුව ඔබගේ දරුවන්ට කිසියම් දක්ෂතාවක් ඇති බව ඔබ දැන සිටිය යුතුය. මෙලොව එළිය දකින සෑම දරුවෙක්ම මුලින්ම දෙමාපියන් වන ඔබට හඳුනා ගැනීමට හැකියාව තිබිය යුතුය. මේ සඳහා ඔබට උසස් අධ්‍යාපනයක් අවශ්‍ය යැයි සිතීම වරදකි. ඕනෑම දෙමව්පියකුට දරුවන් සමඟ කුඩා කල පටන් ඔවුන් සමග ජීවත්වීමෙන් දරුවන්ගේ දක්ෂතා මෙන්ම දුෂ්‍යමාහිත රටාද හඳුනා ගැනීමට හැකියාව ඇත.

## 6. වරදේ බැඳීම්වලින් ගලවා ගැනීම

මිහිපිට ජීවත්වන සෑම සත්වයෙක්ම දැනුවත්කමින් හෝ නොදැනුවත්කමින් විවිධ වැරදි සිදුකිරීමට පෙලඹෙයි. එම සෑම අවස්ථාවකදීම වරදේ ස්වභාවය පහදා දෙමින් ඔවුන්ව වරදෙන් මුදාගැනීමට දෙමාපියන්ට විශේෂ හැකියාවක් තිබිය යුතුය. මෙහිදී දඬුවම් කිරීමට වඩා ආදරය, කරුණාව, සෙනෙහස තුළින් වරදෙන් මුදා ගැනීමට කටයුතු කිරීම කාලෝචිත වේ.

## 7. ආගම් පසුබිම පවරා දීම

මෙලොව උපදින සෑම දරුවකුටම තම දෙමාපියන්ගේ ආගම උප්පත්තියෙන්ම ඇදහීමට අයිතියක් ඇත. එම අයිතිය දෙමාපියන් විසින් පවරාදීමක් මූලිකව සිදුවන්නේ උප්පැන්න සහතිකයේ ආගම නමැති තීරුව සම්පූර්ණ කිරීමෙනි. දෙමාපියන් විසින් උප්පැන්න සහතිකයට පමණක් එය සීමා නොකොට ආගමික පසුබිම පවුල තුළ පෝෂණය කරමින් දරුවා හදා වඩා ගැනීම දෙමාපියන්ගේ කාර්යභාරයකි.



**ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති - ජාතික මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය**

# රුක් රෝපණයට සහ කාබනික පොහොර නිෂ්පාදනයට මුල් වෙයි





යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කෙරෙන "තුරු මිතුරු නව රටක්" ව්‍යාපෘතියට සමගාමීව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහ මහවැලි අධිකාරියේ සහයෝගය ඇතිව පසුගිය නොවැම්බර් 30 වන දින ගලයාය ප්‍රදේශයේ ස්ථාපිත ඉංජිනේරු සේවා පුහුණු පාසලේදී කුඹුක්, මී සහ පොල් පැළ 250 කට අධික ප්‍රමාණයක් රෝපණය කරන ලදී.



ඉංජිනේරු සේවා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් එන්ඩබ්ලිව්පීඑස්එම් පෙරේරා ගේ උපදෙස් මත ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහන සඳහා එම පුහුණු පාසලේ පුහුණුව ලබන භට පිරිස් සහ උපදේශකයන් සිය සහයෝගය දැක්වූහ. එමෙන්ම, කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට සහයෝගය දක්වමින් ඉංජිනේරු සේවා පුහුණු පාසල වෙතින් කාබනික පොහොර සහ දියර පොහොර කිලෝග්‍රෑම් 2000 ක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කරන ලදී.



# "අධික මධ්‍යසාර භාවිතය සහ දුම්බීම, නිවැරදි මුඛ සෞඛ්‍යයට හානි කරයි"

- නාරාහේන්පිට යුද හමුදා රෝහලේ දන්ත ශල්‍ය වෛද්‍ය ලුතිනන් කර්නල් ලෝචන ප්‍රනාන්දු -

**නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ දන්ත ශල්‍ය වෛද්‍යවරයකු වන ලුතිනන් කර්නල් ලෝචන ප්‍රනාන්දු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳව සිය උපාධිය නිම කිරීමෙන් අනතුරුව 2002 වසරේ දී කපිතාන්වරයකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත එක්වී ඇත. අනතුරුව වැලිකන්ද වැලිඔය වව්නියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව, මිරුසුවිල් සහ පලාලි ආදී ප්‍රදේශ ගණනාවක දන්ත වෛද්‍ය නිලධාරියකු ලෙස සේවය කර ඇති ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සංවිධානය කළ මෙහෙයුම් දෙකක් සඳහාද සිය දායකත්වය ලබාදී ඇති විසි වසරක නොකැළැල් වෘත්තීය දිවියකට හිමිකම් කියන ජ්‍යෙෂ්ඨ යුද හමුදා නිලධාරියෙකි. නිවැරදි දන්ත සෞඛ්‍ය තත්වයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාඨක ඔබට වැදගත් වන තොරතුරු රැසක් අළලා ඔහු සමගින් කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් මෙම විශේෂාංග ලිපිය සකස් කෙරිණි.**

**ප්‍රශ්නයඃ-** නාරාහේන්පිට යුද හමුදා රෝහල මගින් සැපයෙන දන්ත වෛද්‍ය සේවාවන් පිළිබඳව යමක් සඳහන් කළොත් ?

**පිළිතුර ඃ-** ඇත්ත වශයෙන්ම සාමාන්‍ය දන්ත වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහාම වෙන් වූ දන්ත වෛද්‍ය ශල්‍යාගාර පහක් දැනටමත් නාරාහේන්පිට යුද හමුදා රෝහල සතුයි. විශේෂඥ සංරක්ෂණ දන්ත ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර, විශේෂඥ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර, විශේෂඥ මුඛ හනුක සහ වක්ත්‍ර ප්‍රතිකාර, දන්ත ඍජුකරණය, දන්ත පොකුරුමය තත්ත්වයන් සම්බන්ධයෙන් පිළියම් කිරීම, නිවැරදි නොවන හනුක සම්බන්ධතා සඳහා වන ප්‍රතිකාර, දන්ත මස්තක සහ පාලම් ප්‍රතිකාර, අධිරෝපණ දන්ත සංරක්ෂණ ප්‍රතිකාර, උසස් ස්නායු පිරවුම් ප්‍රතිකාර ආදී කටයුතු මින් සිදුවන අතර, මේ සෑම අවස්ථාවකදීම ඒ වෙනුවෙන් සුදුසුකම්ලත් ජ්‍යේෂ්ඨ දන්ත වෛද්‍යවරයකු සේවයේ යෙදී සිටිනවා. මෙයට අමතරව ජ්‍යේෂ්ඨ විකලාංග දන්ත ශල්‍ය වෛද්‍යවරුන් දෙදෙනකුත් ස්නායු පිරවීම සම්බන්ධයෙන් කටයුතු කරන තවත් විශේෂඥ වෛද්‍යවරුන්ද නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ සේවය සතුයි. තවද දත් පිරවීම, දන්ත හනු ආශ්‍රිත ප්‍රතිකාර ක්‍රමවේදයන් මෙන්ම දන්ත පිරිසිදු කර ඔප දැමීමේ කටයුතු ද නාරාහේන්පිට යුද හමුදා රෝහලේ දන්ත ශල්‍ය වෛද්‍ය අංශය මගින් සිදු කරනු ලබනවා.




**ප්‍රශ්නය :-** විද්‍යා අංශයෙන් උසස් අධ්‍යාපන කටයුතු සිදු කිරීමේදී අනාගතයේ දී දන්ත වෛද්‍යවරයකු වීමේ බලාපොරොත්තුවම ඔබට තිබුණාද?

**පිළිතුර :-** මා විද්‍යා විෂය ධාරාව වෙනුවෙන් 1993 වසරේදී අපොස (උසස් පෙළ) විභාගයට මුහුණ දී ලකුණු 285 ක් ලබාගනිමින් දන්ත ශල්‍ය වෛද්‍ය පීඨය වෙත ඇතුළත්වීමට සුදුසුකම් ලබා දන්ත ශල්‍ය වෛද්‍යවරයකු වීමට අවශ්‍ය මූලික අඩිතාලම තැබුවා. මා මේ ක්ෂේත්‍රයට පිවිසියේ ඒ අයුරිනුයි.

**ප්‍රශ්නය :-** යමකුට සිය නිවසේ සිටම නිවැරදි මුඛ ස්වස්ථතාවයක් පවත්වා ගැනීම වෙනුවෙන් ඔබ ලබාදෙන උපදෙස් කවරේද?

**පිළිතුර :-** පළමුවෙන්ම සිදු කළ යුත්තේ ඔබට සරිලන නිවැරදිම දත් බුරුසුව කුමක්දැයි තෝරා ගැනීමයි. එමෙන්ම ඔබ ඒ අයුරින් තෝරා ගන්නා දත් බුරුසුවට ඔබේ මුඛයේ අග කෙළවරේ ඇති දත් කරා ළඟාවීමේ හැකියාවක් තිබිය යුතුයි. එමෙන්ම දත් බුරුසුව හොඳින් ග්‍රහණය කරගැනීම වෙනුවෙන් අතට පහසුවන අයුරින් එහි මිට නිමවා තිබීම ද වැදගත්. එසේම දත් මැදීමේදී වුවමනාවටත් වඩා තදින් මැදීම සිදු නොකළ යුතු මෙන්ම දිනකට දෙවරකට වඩා දත් මැදීමද සිදු නොකළ යුතුයි. එවැනි ක්‍රියාවන් නිසාවෙන් දත් මුල් දියවී බොහෝ විට දත් දිරායාමටද ප්‍රධාන හේතුවක් වෙනවා. එමෙන්ම අයිස් ක්‍රීම්, චොක්ලට්, කේක් වැනි අධික සීනි සහිත ආහාර භාවිතය සෑම විටම සීමා කළ යුතුවාක් මෙන්ම ප්‍රධාන ආහාර වේල අතරතුර කෙටි කෑම වර්ග අනුභව කිරීම නවතා දැමිය යුතුයි. එමෙන්ම ඇසිඩ් ගතිය සහිත සෝඩා වර්ගයන් මෙන්ම ශක්ති ජනක පානයන් හා දෙහි යුෂ ආදිය පානය කළ වහා ඔබේ දත්මැදීමේ කටයුතු සිදු නොකළ යුතුයි. ඒ මන්ද එවැනි ඇසිඩ් වර්ග සහිත පානයක් ගැනීමෙන් අනතුරුව එය ඔබගේ දත් වටා ඇති ආරක්ෂක එනමලය වඩාත් මෘදු තත්වයට පත් කරවන නිසයි. වඩාත් වැදගත් කරුණ වනුයේ ඔබගේ මුඛය ආශ්‍රිතව යම් තුවාලයක්, දදයක් දැකීමට ලැබුණහොත් ඒ පිළිබඳව හැකි ඉක්මනින් ඔබගේ දන්ත වෛද්‍යවරයා දැනුවත් කිරීමයි. තවද ඔබගේ දත්වලට ඉතාමත් අහිතකර බලපෑම් ඇති කරවන දුම්කොළ සැපීම, බුලත්විට කෑම, නියපොතු සැපීම, පැන්සල් සැපීම, සිසිල් බීම බෝතල්වල මූඩි කටින් ගලවා ඉවත් කිරීමට යාම, මෙන්ම අධික ලෙස මද්‍යසාර භාවිතය ආදී චර්යාවන්ගෙන් සම්පූර්ණයෙන්ම වැළකීම තුළින් ඔබට දිවි ඇති තෙක් ඔබගේ දත් සුරැකිව තබාගත හැකියි. වර්තමානය වනවිට වැඩිහිටියන්ගේ මෙන්ම කුඩා දරුවන්ගේ දත්ද දිරායාම සිදුවන්නේ බොහෝ විට ඔවුන්ගේ නොසැලකිලිමත් කම නිසාවෙන් බව සඳහන් කළ යුතු වනවා.

**ප්‍රශ්නය :-** නිවැරදි මුඛ ස්වස්ථතාවයක් ඇතිකරගැනීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ශ්‍රී ලාංකේය ජනතාවට නැහැ නේද?

**පිළිතුර:-**

ඇත්තෙන්ම ඔව්, යම් පුද්ගලයකු සෞඛ්‍ය සම්පන්නව නිවැරදි මුඛ ස්වස්ථතාවයක් පවත්වාගෙන යන්නේ නම්, එය වඩා උසස් ජීවන රටාවක මෙන්ම ඔහුගේ පෞරුෂත්වය පිළිබිඹු කරන එක් සංකේතයක් ලෙසද හැඳින්විය හැකියි. එමෙන්ම යම් පුද්ගලයකු නිවැරදි මුඛ ස්වස්ථතාවයක් පවත්වා නොගන්නේ නම්, එය එම පුද්ගලයාගේ කාර්යක්ෂමතාවටද බලපානවා. සමහරවිට එම පුද්ගලයාගේ අයහපත් මුඛ සෞඛ්‍ය පුරුදු හේතුවෙන්, කල් යාමේදී ඔහු හෝ ඇය මුඛ පිළිකාමය තත්වයකට ගොදුරුවීමේ හැකියාවක් ද පවතිනවා. එනිසා වඩා යහපත් ජීවන රටාවක් ගතකිරීම වෙනුවෙන් යහපත් මුඛ සෞඛ්‍ය පුරුදු කුඩා අවධියේ සිටම පුරුදු පුහුණු කරගැනීම ඉතා වැදගත් කටයුත්තක් වනවා.

**ප්‍රශ්නය:-** යම් පුද්ගලයකුට තමන්ගේ දත් බබළන සුදකින් යුතුව පවත්වාගත හැක්කේ කෙසේද?

**පිළිතුර:-** යම් පුද්ගලයකු දිනකට දෙවරක් අනිවාර්යෙන්ම දත් මදිනවා නම් එම තත්වය ඇතිකරගැනීම අපහසු කටයුත්තක් නොවේ. එමෙන්ම නාරාහේන්පිට යුද හමුදා රෝහලේ දන්ත ශල්‍ය වෛද්‍ය අංශය මගින් දත් පිරිසිදුකර ඔප දැමීමේ කටයුතුද සිදු කරනවා. තවද දත්වල මැලියම් බැඳී ඒවා අවපැහැ ගැන්වී ඇත්නම් දන්ත සංරක්ෂණයක් සිදුකොට එම දත්වල නිවැරදි සුදු පැහැය ලබා ගැනීම සඳහා උසස් දන්ත ප්‍රතිකාර ක්‍රමවේදයන්ද සිදුකළ හැකියි.

**ප්‍රශ්නය:-** ඔබ පවසන අයුරින් යම් පුද්ගලයකු දන්ත ශල්‍ය වෛද්‍යවරයකු මුණගැසිය යුත්තේ කොපමණ කලකට වරක්ද?

**පිළිතුර :-** මගේ අදහසට අනුව නම්, සෑම පුද්ගලයකුම සෑම හය මසකටම වරක් දන්ත වෛද්‍යවරයකු මුණගැසී තමන්ගේ දත් පරීක්ෂා කරගැනීම ඉතාම වැදගත්.

**ප්‍රශ්නය:-** ඔබ පවසන අයුරින් කුඩා දරුවකු දන්ත වෛද්‍යවරයකු වෙත රැගෙන යා යුත්තේ එම දරුවා කුමන වයසක පසුවන විටදීද?

**පිළිතුර:-**

දන්ත වෛද්‍යවරුන් නිර්දේශ කරන අයුරින් කුඩා දරුවකු අවුරුද්දක් සපුරන විටදී හෝ එම දරුවාගේ කිරිදත් රෝපණය වී හයමසක කාලයක් ඇතුළත එම දරුවාව දන්ත වෛද්‍යවරයකු වෙත රැගෙන යාම සුදුසුයි.

**ප්‍රශ්නය :-** කුඩා දරුවන්ගේ කිරි දත් ඉවත්වීම සිදුවන්නේ ඔවුන් කවර වයස් සීමාවක් තුළ පසු වෙද්දීද?

**පිළිතුර:-** ළදරුවන්ගේ කිරි දත් වර්ධනය වන්නේ ඔවුන් මවුකුස තුළ සිටියදීමයි. එනමුත් බොහෝ අවස්ථාවන් වල ඔවුන්ට වයස හය මසක් හෝ අවුරුද්දක් වනතෙක් එම දත් විදුරුමසින් එළියට පැමිණීම සිදුවන්නේ නැහැ. කෙසේ නමුත් ඔවුන්ට වයස අවුරුදු 05 හෝ 06 ක් පමණ වන කාලසීමාව තුළදී එම කිරිදත් වැටී ස්ථිර දත් රෝපණය වීම ආරම්භ වනවා.

**ප්‍රශ්නය :-**

දත්වල ශක්තිය දීර්ඝ කාලයක් ඒ අයුරින්ම පවත්වා ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයන් කවරේද?

**පිළිතුර:-** මූලික වශයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග යන් අතර හැකිතාක් සීනි අධික ආහාර පාන වර්ගයන් භාවිතය අවම කිරීම ඉතා වැදගත් එමෙන්ම හැකි සෑම විටම ඔබගේ දත්වල එනැමලය ආරක්ෂා කරවන ආහාර හා පාන වර්ගයන් පමණක් අනුභව කිරීම සිදුකළ යුතුයි. මෙයට අමතරව සෑම හය මසකට වරක්වත් ඔබගේ දන්ත වෛද්‍යවරයා හමුවී දත් පරීක්ෂා කරගැනීම දිවි ඇතිතෙක් ඔබගේ දත් සුරැකිව තබා ගැනීමට තවත් හේතුවක් වනවා.



සටහන
ලුතිනන් දුමින්ද සෙනරත්
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# අන්තර් රෙජිමේන්තු හා දෘෂ්‍යාබාධිත/ආබාධිත රණවිරු අභියෝගතා චෙස් තරඟාවලිය 2021

ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුව විසින් සංවිධානය කරන ලද අන්තර් රෙජිමේන්තු හා දෘෂ්‍යාබාධිත/ආබාධිත රණවිරු අභියෝගතා චෙස් තරඟාවලිය - 2021 අභිමංසල 111 පාන්ගොල්ල සුවසහන නිකේතනයේ සේනාවිධායක කර්නල් ඒඑච් විජේගුණවර්ධන ආර්එස්පී ගේ මගපෙන්වීම හා සංවිධාන ශක්තිය මත ඉකුත් නොවැම්බර් 17 සහ 19 යන දෙදින අභිමංසල 111 හිදී ඉතා උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

එහි සමාරම්භක අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී සහභාගී වූහ.

තරඟාවලියේ පළමු දින කේවල තරඟ සහ දෙවන දින කණ්ඩායම් තරඟ පැවැත්වූ අතර, එහිදී කේවල අංශයෙන් ප්‍රථම ස්ථානය අභිමංසල 111 හි රණක්ෂිතයට පත් සෙ/329898 කෝප්‍රල් දසනායක ආර්ඩීඩීඑස් ද දෙවන ස්ථානය සෙ/472169 සැරයන් ප්‍රේමලාල් ඩීජීඑම් ද තෙවන ස්ථානය රණවිරු සෙවණ - රාගම හි සෙ/419691 බනි 11 සමන්ත කේඩබ්ලිව්ජ් විසින් ද හිමිකරගනු ලැබූහ. දෙවන දින කණ්ඩායම් තරඟ පැවැත්වූ අතර, එහිදී වැඩිම ලකුණු හිමි කණ්ඩායම වශයෙන් අභිමංසල 111 කණ්ඩායම ප්‍රථම ස්ථානය දිනා ගනිමින් දෘෂ්‍යාබාධිත/ආබාධිත රණවිරු අභියෝගතා චෙස් තරඟාවලියේ 2021 වර්ෂයේ ශූරතාවය හිමිකර ගන්නා ලදී. එසේම පිළිවෙලින් දෙවන හා තෙවන ස්ථාන රණවිරු සෙවණ - රාගම හා අභිමංසල 11 - කඹුරුපිටිය නියෝජනය කළ කණ්ඩායම විසින් දිනා ගත්හ.







# හරවත් වැඩමුළු





ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපතිගේ මගපෙන්වීම යටතේ මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සම්බන්ධතාවෙන් යුතුව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳව වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් 23 සහ 24 යන දෙදින තුළ ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) හිදී පවත්වන ලදී. විශ්‍රාමික බ්‍රිගේඩියර් *Jaeques Lemay* මහතා, කොළඹ පිහිටි කලාපීය සන්නද්ධ හා ආරක්‍ෂක හමුදා නියෝජිත *Claudia* සහ චන්න ජයවර්ධන යන මහත්වරු විසින් මෙහෙයවූ මෙම දේශනයට ආරක්‍ෂක සේනා (යාපනය) බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් සහ මාණ්ඩලික නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.





ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපතිගේ අදහසකට අනුව භූ විද්‍යා සමීක්‍ෂණ හා පතල් කාර්යාංශය සම්බන්ධීකරණයෙන් හා එහි නීතිමය රාමුව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඉකුත් දෙසැම්බර් 03 වන දින 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් කිලිනොච්චි නෙළුම් පියස ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

# බලඇණි පුහුණු පාඨමාලාව අරඹමින්






112 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පිහිටි 3 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලඇණි පුහුණු පාඨමාලාව ඉකුත් දෙසැම්බර් 01 වන දින වලමණ්ඩිය බලඇණි පුහුණු පාසලේදී ආරම්භ විය. එහි ආරම්භක දේශනය 112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සිදු කරන ලදී.

# යුද්ධ හමුදාවෙන් සිවිල් ජනතාව වෙත පරිත්‍යාග රැසක්



මුලතිව් ප්‍රදේශයේ ජීවත්වන ජනතාව සහ යුද්ධ හමුදාව අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව හා සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් ඉකුත් දෙසැම්බර් 03 වන දින අම්බලපෙරුමාල් ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ප්‍රදානත්වයෙන් සිදු කරන ලදී.

# නිසට සෙවණක් ලබා දෙයි



562 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්එස් ප්‍රේමවංශ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සම්බන්ධීකරණයෙන් ජාත්‍යන්තර විපස්සනා මධ්‍යස්ථානයේ මධ්‍යස්ථානාධිකාරී පූජ්‍ය උඩුදුම්බර සෝභිත හිමිගේ ප්‍රධාන මූල්‍ය දායකත්වය මත වව්නියාව 281 ඩී, ශාස්ත්‍රිකුලම් ග්‍රාමසේවා වසමේ අඩු ආදායම්ලාභී පවුලක් වන ශාන්ත වඩිවෙල් මහතා හට නව නිවෙසක් ඉදිකර භාරදීම ඉකුත් දෙසැම්බර් 01 වන දින සිදුකෙරිණ. මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය 15 (සෙව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සපයනු ලැබූහ.

# අභිමන් ගමනක 12 වසක මතක සැමරුම





66 වන පාබල සේනාංකයේ 12 වන සංවත්සරය පසුගිය දෙසැම්බර් 10 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු අභිමානවත් සැමරුම් උත්සවයක් එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහිදී පුනරින් විහාරස්ථානයේ පැවති බෝධිපූජා පින්කම හා පුනරින් ශාන්ත මාර්මස් දේවස්ථානයේ සිදුකළ යාඥා මෙහෙයට ප්‍රධාන තැනක් හිමිවිය. 66 වන පාබල සේනාංකයේ අභිමානවත් ගමන් මඟ සැමරුමට එහි සියලු නිලයෝ සාමූහිකව එක්රොක් වූහ.

# සංචාරයක නතු වින්ති





යුද්ධ හමුදා කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කර දැනට වසර 02 කට අධික කාලසීමාවක් ගත වී ඇති අතර, යුද්ධ හමුදා මූලස්ථනයේ අධිතාක්ෂණික ගොඩනැගිලි සංකීර්ණය යුද්ධ හමුදාවේ අභිමානය පිළිබිඹු වන ආකාරයට කාලානුරූපීව නඩත්තු කිරීම එම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම වේ. එම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පී විමලසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ මේ වන විට යුද්ධ හමුදා මූලස්ථානයේ කාර්යක්ෂමව සිදුකෙරෙන නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම සඳහා උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් පීජේපී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ඉකුත් දෙසැම්බර් 07 වන දින එහි සංචාරයක නිරත විය. එහිදී එම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ සොයා බැලූ හෙතෙම එහි භාවිත කරනු ලබන යන්ත්‍ර සූත්‍ර ද සිය නිරීක්ෂණයට බඳුන් කළේය.

# විරු දිරියෙන් නව සෙවණක්





15 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියලු නිලධාරි/සෙසු නිලයන්ගේ ශ්‍රම දායකත්වයෙන් සුන්දරපුරම්, වවුනියාව ප්‍රදේශයේ පදිංචි ගෝවින්දන් ශාන්ත වඩිවේල් යන අය වෙනුවෙන් ඉදිකරන ලද නව නිවෙසක් පසුගිය දෙසැම්බර් 01 වන දින ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් එම පවුලේ සාමාජිකයන් වෙත භාර දෙන ලදී. පූජ්‍ය උඩුදුම්බර සෝභිත ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් මාස්පොත ග්‍රීන්විලේජ් හි පදිංචි නිර්මලා අධිකාරි මහත්මිය සහ අනුර කෙහෙල්ඇල්ල මහත්මා ඊට ධන පරිත්‍යාග ලබා දුන්හ.

# නව සෙවණක වැඩ අරඹයි





කොළඹ මියුසියස් විද්‍යාලයීය ආදිශිෂ්‍යාවන්ගේ සංගමයේ මූල්‍ය දායකත්වයෙන් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභී පවුලක් වන ඩබ්ලිව්.ඒ. මදූශා ප්‍රශානී ධර්මපාල යන අය වෙත නව නිවෙසක් ඉදිකරදීමට කටයුතු කෙරිණ. 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් දෙසැම්බර් 13 වන ඉදිකිරීමට නියමිත එම නිවෙස සඳහා මුල්ගල තබන ලදී.

# පූජා සත්කාරයක්





64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූපීආර් වීරකෝන් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී 2021 දෙසැම්බර් 01 වන දින ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය රෝහලෙහි ක්ෂේත්‍ර සංචාරයක නිරත විය. එහිදී රෝහල් පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කරදෙන ලෙස එහි කාර්ය මණ්ඩලය සේනාංකාධිපතිගෙන් කළ ඉල්ලීමකට අනුව එය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් 641 වන පාබල බලසේනා මූලස්ථානයේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 06 වන දින සිදුකරන ලදී. ඒ සඳහා සේනාංකය යටතේ ඇති බලසේනා, ඒකක වල භටපිරිස් මෙන්ම ප්‍රදේශවාසීන් රැසක්ද එක්වූහ.

# ජන දිවියට සවියක්ව





542 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්එස්වී ප්‍රනාන්දු යූඑස්පී අයිජී ගේ උපදෙස් මත එම ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 26 ක් සඳහා ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් කජු පැළ 400 ක් බෙදා දීමේ වැඩසටහනක් ඉසමතලතිව් ප්‍රජා මධ්‍යස්ථානයේදී පසුගිය දෙසැම්බර් 07 වන දින පවත්වන ලදී. එම අවස්ථාවට 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ හා 15 (සේවා) ගැමුණු හේවා බළකායේ නිලධාරී සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# පරිත්‍යාගයක්




513 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑස්එම් ෆාරිස් යූඑස්පී ගේ මඟපෙන්වීම යටතේ එම පාබල බලසේනාවේ භටපිරිස් විසින් ඉකුත් නොවැම්බර් 20 වන දින කීරමලෙයි ප්‍රදේශයේ ගැබිණි මාතාවන්ට පෝෂ්‍යදායී අත්‍යවශ්‍ය ආහාර පාර්සල් තොගයක් පරිත්‍යාග කරන ලදී. මෙම අවස්ථාවට 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම්, යුද්ධ හමුදා සාමාජිකයන්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.






ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපතිගේ උපදෙස් පරිදි සිදු කරනු ලබන ප්‍රජාසත්කාරක වැඩසටහන් යටතේ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ස්ථාපිත රජයේ රෝහල, ප්‍රධාන සැරහුම් මධ්‍යස්ථානය සහ 64 වන පාබල සේනාංක මූලස්ථානය වෙත ඇඳ ඇතිරිලි, කොට්ටා උර, තුවා ඇතුළු රෙදිපිළි පහසුකම් ලබාදීම සිදුකරන ලදී. එයට සමගාමීව ඔඩ්ඩුසුඩාන් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් 25 දෙනකු සඳහා දිවා ආහාරය ලබා දීමද, 64 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූපීආර් වීරකෝන් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 01 වන දින සිදු කෙරිණ. මෙම සත්කාරය සඳහා රෙදිපිළි ලබාදීමේ දායකත්වය ශ්‍රී ලංකා හොටෙල් පාසල් උපාධිධාරීන්ගේ සංගමය විසින් ලබා දෙන ලදී.

# දිරිය දරුවන්ට ඉගෙනුමට අත්වැලක්



9 වන ගජබා රෙජිමේන්තුවේ භට පිරිස් ගැමුණුපුර ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් 35 දෙනකු සඳහා එක් සිසුවකුට රුපියල් 6000.00 ක් බැගින් වටිනා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 14 වන දින සිදුකරන ලදී. තවද තිස්සපුර විද්‍යාලය වෙත ද පුස්තකාල උපකරණ, පරිගණකයක් සහ පාසල් සිසුන් 170 දෙනකු සඳහා එක් සිසුවකුට රුපියල් 6000.00 බැගින් වටිනා පාසල් උපකරණ බෙදා දීමට ද කටයුතු කෙරිණ. මෙම අවස්ථාවට 623 වන පාබල බලසේනාධිපති, 9 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ආගමික කටයුතුවලට මුල්තැනක් දෙමින්





සිලාවතුර සිංහල විජයගම ශ්‍රී විජයතිලක විහාරයේ කඨින චීවර උත්සවය ඉකුත් නොවැම්බර් 07 වන දින එම විහාරස්ථානයේදී මහත් උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබීය. මෙහිදී කඨින පෙරහැර හා ස්වාමීන් වහන්සේලා 13 නමකට දානය පිළිගන්වන ලද අතර, එම උත්සවයට සමගාමීව නව චෛත්‍යයක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම හා අඩු ආදායම්ලාභී පවුල් 100 කට ආහාර පාර්සල් ලබාදීමද සිදුකෙරුණි. බ්‍රිගේඩියර් කේඩබ්ලිව්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී සහ පරිත්‍යාගශීලීන් කිහිපදෙනකු මේ සඳහා දායකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහභාගී වූ අතර, 541 සහ 542 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු ද එක්වූහ.

# නව නිවාස පරිත්‍යාගයක්



12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ කතරගම ගෝතමීගම පදිංචි ජීඑස් වසන්තා කුමාරි සහ වීරවිල නව නගරයේ පදිංචි කේඑච් පියරත්න යන අයවලුන් වෙනුවෙන් ඉදි කෙරූ නව නිවෙස භාරදීම ඉකුත් නොවැම්බර් 28 සහ 30 යන දෙදින සිදු කරන ලදී. මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය මේජර් සම්පත් වීරසූරිය (විශ්‍රාමික) සහ දානපති ඩී. අමරතුංග යන මහත්වරුන් විසින් සපයනු ලැබූහ.





# ගිනි වැළැක්වීම හා ගිනි නිවීම

සටහන
ගුවන් හමුදා ගිනි නිවීම් අංශයේ
ප්‍රකාශනයකිනි

ගින්නක් ඇතිවීම කොයි මොහොතේ සිදුවේදැයි කාහටවත් පැවසිය නොහැකිය. සුළු අත්වැරැද්දකින් හෝ නොසැලකිලිමත්කම නිසා ඇති වන ගින්නකින් සිදුවන විනාශය කෝටි ගණනක් විය හැකිය.


ගින්නක් නිසා ජීවිත හා දේපලවලට සිදුවිය හැකි හානි හැකිතරම් දුරට අවම කරගැනීම සඳහා ගිනි වැළැක්වීම, ගිනි නිවීම සහ ගිනි පාලනය පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීම අවශ්‍ය වේ. මෙම සටහනෙන් බලාපොරොත්තු වන්නේ එම මූලික දැනුම හා අවබෝධය ලබා දීමයි.

## දහනය (*COMBUSTION*)

දහනය යනු තාපය සහ ආලෝකය උපදවන රසායනික ප්‍රතික්‍රියාවක් හෝ ප්‍රතික්‍රියා සමූහයකි. දහනය සිදුවීමට සාධක තුනක් අවශ්‍ය වේ.

1. දැවෙන සුළු ඉන්ධනයක් (*FUEL*)
2. ඔක්සිජන් (*OXYGEN*)
3. තාපය (*HEAT*)

ඉහත සාධක තුන එකිනෙකට සම්බන්ධව තිබෙන තෙක් දහනය දිගටම සිදු වේ.




## ගිනි නිවීමේ ක්‍රම

ගින්නක් (දහනය) ඇතිවීමට අවශ්‍ය වන සාධක තුනෙන් එකක් ඉවත් කිරීම මගින් ගින්නක් නිවිය හැකිය. ඒ අනුව ගිනි නිවීමේ ක්‍රම තුනක් ඇත.

1. ඉන්ධන ඉවත් කිරීම
2. ඔක්සිජන් ඉවත් කිරීම
3. තාපය ඉවත් කිරීම




ගිනි නිවීමේදී ඉහත ක්‍රමවලින් එකක් හෝ වැඩි ගණනක් පාවිච්චි කළ හැකිය. ගිනි නිවීමේ සරල මූලධර්මය මෙය වේ.

## ඉන්ධන ඉවත් කිරීම හෝ සීමා කිරීම මගින් ගින්නක් නිවීම (*STARVATION*).




මේ සඳහා ක්‍රම තුනක් භාවිතා කළ හැකිය.

1. ගින්න අවටින් ඇති දැවෙන සුළු ද්‍රව්‍ය ඉවත් කිරීම

2. ගින්නට හසුවී ඇති දෙය අවට ඇති දැවෙන සුළු ද්‍රව්‍ය වෙතින් ඉවතට ගෙන යාම

3. ගිනි ගන්නා දෙය කොටස්වලට කැඩීම. (ගින්න කුඩා වීමෙන් එය පහසුවෙන් නිවීම හෝ එම ද්‍රව්‍ය ඇවිළීයාමට ඉඩ හැරිය හැකිය)

## ඔක්සිජන් ඉවත් කිරීම හෝ සීමා කිරීම මගින් ගින්නක් නිවීම (*SMOTHERING*).




මෙම ක්‍රමයට ගිනි නිවීම කිහිප ආකාරයකට සිදුකළ හැකිය.

1. ආවරණයක් මතින් ගිනි ගන්නා ද්‍රව්‍ය මතුපිට වැසීමෙන්.
2. වායු පෙණ යෙදීමෙන්.
3. වියළි කුඩු යෙදීමෙන්.
4. යුරේනියම් + ප්ලූටෝරියම් + තෝරියම් + මැග්නීසියම් වැනි මිශ්‍රණ හෝ ඇස්බැස්ට්‍රස් කුඩු යෙදීමෙන්.
5. කාබන්ඩයොක්සයිඩ් (අළුගාරිකාම්ල වායුව) හෝ නයිට්‍රජන් වායුව යෙදීමෙන්.

## තාපය ඉවත් කිරීම (සිසිල් කිරීම) මගින් ගින්නක් නිවීම (*COOLING*).




මෙම ක්‍රමයට ගිනි නිවීමේදී භාවිත කරනු ලබන්නේ ජලයයි. ජලය ගින්න මතට යෙදීම ක්‍රම දෙකකට සිදුවිය හැකිය.

1. ජල විසරණයක් වශයෙන් (*SPRAY*)
2. ජල වංවුවක් වශයෙන් (*JET*)

ජලයට හොඳ තාප ධාරිතාවක් ඇති අතර, ගින්නකට ජලය යෙදූවිට එහි ඇති තාපය ජලය මගින් උරාගනු ලැබූ නටන උෂ්ණත්වයටත් ඉන්පසු වාෂ්ප බවට පත්වීමත් සිදු වේ. මෙසේ ජලය ග්‍රෑම් 1 ක් නටන උෂ්ණත්වයට පත්වීම සඳහා කැලරි 85 ක්ද, නටන උෂ්ණත්වයේ සිට වාෂ්ප බවට පත්වීම සඳහා කැලරි 540 ක තාප ප්‍රමාණයක්ද උරාගනු ලබන අතර, ජලය ග්‍රෑම් 1 ක් සම්පූර්ණයෙන් වාෂ්ප බවට පත්වීම සඳහා කැලරි 625 ක ප්‍රමාණයක් උරා ගැනේ. මේ අනුව තාපය අඩුවීමෙන් ගින්න තව දුරටත් පවත්වාගෙන යාමට නොහැකිව ගින්න නිවේ.

## ගිනි වර්ග

ගින්නක් නිවීමේදී ගිනි වර්ගය කුමක්ද යන්න දැනගැනීම ඉතා වැදගත්ය. ගින්නට හසුවී ඇති ද්‍රව්‍ය පවතින ස්වභාවය අනුව ගිනි වර්ග කර ඇත.

1. *A* වර්ගයේ ගිනි - කාබනික ගිනි (ලී, රබර්, ප්ලාස්ටික්, රෙදි, පත්තර වැනි)
2. *B* වර්ගයේ ගිනි - තෙල්, ගෑස් සහ ඒ සමාන ද්‍රව්‍ය (පෙට්‍රල්, ඩීසල්, ග්‍රීස්)
3. *C* වර්ගයේ ගිනි - විදුලි ගිනි (විදුලි උපකරණවල ඇති වන ගිනි

විදුලි ගින්නකදී විදුලිය විසන්ධි කළ විට අනෙක් වර්ග තුනෙන් එකකට වැටේ.

4. *D* වර්ගයේ ගිනි - ලෝහ ගිනි (ඇලුමිනියම්, මැග්නීසියම්, ඊයම් වැනි)

ගිනි නිවීමේ මාධ්‍ය තෝරා ගැනීමේදී ගිනි වර්ග අනුව සුදුසු ගිනි නිවීමේ මාධ්‍යයක් තෝරාගත යුතුය. විදුලි ගින්නක් අවස්ථාවක ජලය පාවිච්චි කළහොත් ජලය විදුලි සන්නායක බැවින් සමහර විට එය පාවිච්චි කරන අයට අනතුරක් සිදුවීම හා ගින්න වැඩි දියුණු වීමටද හේතුවනු ඇත. විශේෂයෙන් ගිනිවලට ජලය යෙදීම මගින් ජලයට වඩා ඝනත්වයෙන් අඩු වීම නිසා එම ද්‍රව්‍ය ජලය මත පාවී යාමෙන් ගින්න තවදුරටත් පැතිර යෑමට හේතුවේ. එම නිසා ගිනි වර්ග අනුව සුදුසු ගිනි නිවීමේ මාධ්‍ය තෝරා ගැනීමට දැනුම තිබිය යුතුය.

## ප්‍රථමාධාර ගිනි උපකරණ

ගින්නක් ආරම්භක අවස්ථාවේ නිවීමට පාවිච්චි කිරීම සඳහා ගිනි නිවීමේ මාධ්‍ය පුරවා ඇති පහසුවෙන් අතින් ඔසවාගෙන යා හැකි උපකරණයෙකි. එහි අඩංගු ගිනි නිවීමේ මාධ්‍ය අනුව හඳුනා ගැනීමට නියමිත වර්ණයක් ඇත.

## ගිනි වර්ගය අනුව පාවිච්චි කිරීමට සුදුසු ගිනි උපකරණ

| ගිනි වර්ගය | පාවිච්චි කිරීමට සුදුසු ගිනි උපකරණ |
|---|---|
| ***A*** වර්ගයේ ගිනි | ජලය අඩංගු ගිනි උපකරණ වෙනත් ඕනෑම ගිනි උපකරණයක් පාවිච්චි කර ගින්න නිවිය හැකිය. වියදම් ගැන සලකා බැලීමේදී වඩාත් සුදුසු ජලය අඩංගු ගිනි උපකරණයක් පාවිච්චි කිරීමයි. |
| ***B*** වර්ගයේ ගිනි | වායු පෙණ ගිනි උපකරණ වියළි කුඩු ගිනි උපකරණ කාබන්ඩයොක්සයිඩ් ගිනි උපකරණ |
| ***C*** වර්ගයේ ගිනි | වියළි කුඩු ගිනි උපකරණ කාබන්ඩයොක්සයිඩ් ගිනි උපකරණ |
| ***D*** වර්ගයේ ගිනි | වියළි කුඩු උපකරණ කාබන්ඩයොක්සයිඩ් ගිනි උපකරණ |

1. ජලය - රතු පාට (*RED*)
2. වායු පෙණ - ක්‍රීම් පාට (*PALE CREAM*)
3. වියළි කුඩු - නිල් පාට (*FRENCH BLUE*)
4. කාබන්ඩයොක්සයිඩ් - කළු පාට (*BLACK*)

1998 වර්ෂයේ සිට සියලුම ප්‍රථමාධාර ගිනි උපකරණ වර්ගවල පැහැය රතුපාට වශයෙන් වෙනස් වී ඇති බව සැළකිය යුතුය.

## ගින්නක් ඇතිවීමට හේතු

ගින්නක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් කරුණු තුනක් හේතු වේ.

1. නොදැනුවත්කම
2. නොසැලකිලිමත්කම
3. හදිසි අනතුරු

- ගිනි වැඩි වශයෙන් ඇතිවන්නේ නොසැලකිලිමත්කම නිසයි. නොසැලකිලිමත්කමින් ඇතිවන ගිනි කිහිපයකට උදාහරණ පහත දැක්වේ.
- පාවිච්චි කරන ලද දුම්වැටියක්, ගිනි කූරක් වැනි දෙයක් නොනිමා ගිනි ගන්නා සුළු ද්‍රව්‍ය මතට විසි කිරීම.
- ස්වයං දහනය සිදුවිය හැකි ද්‍රව්‍ය වැරදි ලෙස ගබඩා කිරීමෙන්.
- ඇසිඩ්, පහසුවෙන් ගිනි ගන්නා ද්‍රව්‍ය සමඟ එකට ගබඩා කිරීමෙන්.
- ගිනි ගන්නා සුළු දව ඉන්ධන වැරදි ලෙස පරිහරණය කිරීම.
- දෝෂ සහිත විදුලි රැහැන් සහ විදුලි උපකරණ පාවිච්චිය.
- ශීතකරණ රූපවාහිනී යන්ත්‍ර ආදිය ප්‍රමාණවත් වාතාශ්‍රයක් නොලැබෙන තැන්වල තබා පරිහරණය කිරීම.
- ඉස්ත්‍රික්ක විදුලි කේතල වැනි දේ පාවිච්චි කරන අතර, වෙනත් වැඩවල යෙදීම.
- නීති විරෝධී ලෙස විදුලිය ලබා ගැනීම.

## ගිනි වැළැක්වීම

ගින්නක් ඇති වීමට හා පැතිර යාමට මූලික හේතු සාධක ඉවත් කිරීම මගින් ගිනි වැළැක්විය හැකිය. මිනිසුන් ජීවත්වන සේවය කරන ස්ථාන ගබඩා කාමර වල සහ අවට පිරිසිදු කර නිතරම ක්‍රමානුකූලව හොඳ තත්වයෙන් පවත්වා ගැනීම හා නඩත්තු කිරීම *(GOOD HOUSE KEEPING)* මගින් ගිනි වළක්වා ගැනීමට හැකි වේ. එවැනි හොඳ පාලනයක් නැති කම නිසා ගින්නක් ඇතිවීම හා ඇතිවන කුඩා ගින්නක් පැතිරයාමට හේතු සාධක වේ. එවැනි දුර්වල පාලනය හා නඩත්තු පහත ලක්ෂණ වලින් හඳුනා ගත හැකිය.

- පාවිච්චියෙන් තොරව ඉවතලන අනවශ්‍ය දෑ කුණු රොඩු ආදිය තැන තැන එක් රැස්ව තිබීම.
- දෝෂ සහිත විදුලි රැහැන් සහ වැඩි ධාරිතා ඇති විදුලි පරිපථ.
- අනතුරුදායක ඉක්මනින් ගිනි ගන්නා ද්‍රව්‍ය දව සහ වායු වැරදි ලෙස ගබඩා කිරීම සහ පරිහරණය.
- අලුත්වැඩියා නොකරන ලද කැඩුණු දොර ජනෙල් වහල ආදිය.

## ගින්නක් හඳුනා ගත් කෙනකු ක්‍රියා කළ යුතු ආකාරය.

- ගින්න හඳුනාගෙන ක්ෂණිකව ගින්න නිවා දැමීමට කටයුතු කිරීම සහ ගින්න පැතිරයාම වැළැක්වීම (ප්‍රථමාධාර ගිනි උපකරණයක් භාවිතා කිරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින්)
- තනිව එය නිවා දැමීම අපහසු යැයි හැගේ නම් අවට සිටි අයගේ උදව් ආධාර ඉල්ලා කෑ ගැසීම, ගින්න පිළිබඳ අන් අයගේ අවධානය යොමු කිරීමට ගිනි අනතුරු සංඥා නාද කිරීම.
- ගින්න පිළිබඳ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දීම සහ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවෙන් පැමිණි පසු ඔවුන්ට ගිනි නිවීම කටයුතුවලදී සහාය දීම.
- ගින්න පිළිබඳ ආයතනයේ වගකිව යුතු පුද්ගලයන්ට දැනුම් දීම.

## ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ හදිසි දුරකථන අංක

1. 0094-11-2441044

ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව සමඟ දුරකථනයෙන් සම්බන්ධ වීමට නොහැකි වුවහොත් පොලිස් හදිසි ඇමතුම් අංශය 119 මගින් හෝ පොලිස් මූලස්ථානය +94 11 2421111 මගින් පණිවිඩය ලබා දීමට කටයුතු කරන්න.

## ගිනි ඇමතුමක් ලබාදීමේදී පහත සඳහන් තොරතුරු සැපයීම අවශ්‍ය වේ

- ගින්න ඇති ස්ථානය
- ලිපිනය
- පැමිණිය හැකි කෙටිම මාර්ගය

පැමිණෙන ගිනි කණ්ඩායමට මාර්ගය පැහැදිලිව දැකිය හැකි සලකුණු දැක්වීම (ප්‍රසිද්ධ ගොඩනැගිලි අතුරු මාර්ගයක් නම් හැරිය යුතු ස්ථානය ආදී වශයෙන්)

- ගිනි වර්ගය

ගින්නෙන් ජීවිත අනතුරු ඇත්නම් ඒ පිළිබඳව විස්තර, දුරකථන ඇමතුම් ලබාදෙන පුද්ගලයාගේ නම සහ දුරකථන අංකය

- දුරකථන අංකය

දුරකථන ඇමතුම ලබාදීමෙන් පසු දුරකථනය ළඟ මොහොතක් රැඳී සිටීම අවශ්‍ය වන අතර, ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවෙන් දුරකථන ඇමතුමේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට උත්සාහ කරන බැවින් දුරකථනය පාවිච්චි කිරීමෙන් වැළකී සිටිය යුතුය. (මහා මාර්ගයේ ඇති දුරකථන කුටි වලින් ඇමතුම් ලබා ගැනීමේදී එම ඇමතුම් පරීක්ෂා කිරීම අපහසු වන බැවින් එවැනි දුරකථන කුටිවලින් ඇමතුම් ලබා දීමෙන් වැළකී සිටීමට උත්සාහ කළ යුතුය)

# සැබෑ කළ නිවාස සිහින





111 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශය තුළ ජීවත්වන දිළිඳු පවුලක් සඳහා 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද නව නිවෙසක් ඉකුත් ඔක්තෝබර් 23 වන දින භාර දෙන ලදී. එම අවස්ථාවට ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ සහ වාරිමාර්ග සංවර්ධන ගරු අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමන්, 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

තවද මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉතාමත් අසරණව ජීවත්වන පවුලක් වෙනුවෙන් ඉදිවුණු නව නිවෙසක්ද ඉකුත් ඔක්තෝබර් 22 වන දින එම පවුල වෙත භාර කෙරිණ. තනූජා නඩරාජා මහත්මිය සහ ඇයගේ පවුලේ අය විසින් රුපියල් ලක්ෂ 06 කට අධික වියදමක් දරා ඉදිකරන ලද මෙම නිවෙස භාර දීමේ අවස්ථාවට 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 111 වන පාබල බලසේනාධිපති ඇතුළු යුද්ධ හමුදා නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් පිරිසක් එක්වූහ.

# මාහැඟි පරිත්‍යාගයක්





1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ 70 වන සංවත්සර උත්සවය නිමිත්තෙන් මොරටුව සර්වෝදය සුවසෙත, ලීලා ජයසේකර ළමා සංවර්ධන මධ්‍යස්ථානය සහ ළදරු පෝෂණ මධ්‍යස්ථානය වෙත පූර්ව සංවර්ධන ළමාවියේ පසුවන සියලුම දූ දරුවන් හට අත්‍යවශ්‍ය වියළි ආහාර, ළදරු ආහාර සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමක් ඉකුත් නොවැම්බර් 27 වන දින සිදුකරන ලදී. තවද 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායට අයත් සෙසුනිලයකුගේ විශේෂ අවශ්‍යතාවන් සහිත දරුවකු වෙත කිහිලිකරුවක් පරිත්‍යාග කිරීමද එම ඒකකයේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ.

# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මඟින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රචාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු

## Fed up of

යම්කිසි ක්‍රියාවක් සම්බන්ධව ප්‍රකාශ කිරීමේදී **"එය එසේ කිරීම එපා වෙලා, කලකිරිලා"** ආදී වශයෙන් යමක් පිළිබඳව ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍යය රචාව භාවිත වේ.

***Fomular*** :- සූත්‍රය

**Subject + Am/Is/Are + Fed up of + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + ඇම්/ඊස්/ආ + ෆෙඩ් අප් ඔෆ් + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + එය එසේ කිරීම එපා වෙලා, කලකිරිලා + ක්‍රියා පදය + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. I am fed up of advicing her.
   අයි ඇම් ෆෙඩ් අප් ඔෆ් ඇඩ්වයිසින්ග් හර්
   මට එපා වෙලා ඇයට අවවාද කරලා.

2. She is fed up of cooking
   ෂී ඊස් ෆෙඩප් ඔෆ් කුකින්ග්.
   ඇයට පිසීම එපා වෙලා.

3. We are fed up of studying
   වී ආ ෆෙඩ් අප් ඔෆ් ස්ටඩින්ග්.
   අපිට පාඩම් කරලා එපා වෙලා.

***Nota Bene*** / සැ:යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- ***Subject :-*** කර්තෘ පදය ඒකවචන හා බහුවචන කර්තෘ පද පහත පෙන්වා දී ඇති පරිදි භාවිත වේ.

  - **Am** - වෙමි, සිටිමි යන අරුථ ඇතිව **I** - මම යන කර්තෘ පදය සමඟ පමණක් භාවිත වේ.
  - **Is** - වෙයි, සිටියි, ඉඳියි යන අරුථ ඇති ඒකවචන (*Singular - He* - ඔහු, *She* - ඇය, *It* - ඌ) යන කර්තෘ පදය සමඟ පමණක් භාවිත වේ.
  - **Are** - වෙනවා, සිටිනවා, ඉන්නවා යන අරුථ ඇති බහුවචන (*Plural - I* - මම, *We* - අපි, *You* - ඔබ/ඔබලා, *They* - ඔවුන්) යන කර්තෘ පදය සමඟ පමණක් භාවිත වේ.

- ***Fed up of :-*** එය එසේ කිරීම එපා වෙලා, කලකිරිලා ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම ඛණ්ඩය කිසිඳු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිත වේ.

- ***Verb :-*** ක්‍රියා පදය වාක්‍යයේ භාවිත කිරීමේදී (ing) ක්‍රියා පදයක් ලෙස භාවිත කළ යුතුය.

- ***Object :-*** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිත වේ.


I am fed up of advicing her.

**Analysis of the sentence formation** - වාක්‍යය රචාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

**Subject + Am/Is/Are + Fed up of + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + ඇම්/ඊස්/ආ + ෆෙඩ් අප් ඔෆ් + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + එය එසේ කිරීම එපා වෙලා, කලකිරිලා + ක්‍රියා පදය + කර්මය (**ing** ස්වරූපය) + ඉතිරිය.

අයි ඇම් ෆෙඩ් අප් ඔෆ් ඇඩ්වයිසින්ග් හර්
මට එපා වෙලා ඇයට අවවාද කරලා.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



**කපිතාන් චමින්ද ලියනගේ**
**ශ්‍රීලයුහෙදුසේබ**
**ජනමාධ්‍ය අම - යුහමු**
**www.englishvision.lk**

# හිනාවීම...

"තමා මේ තමාගෙ පුරුෂයාව දික්කසාද කරන්න හේතු මොනවාද?"

"ලැජ්ජා වන ලෙස හැසිරීම සහ අපහාස කිරීම හාමුදුරුවනේ"

"ඒ කොහොමද?"


"මම එයාට මොකෙන් ගැහුවත් එයා අහකට පැනල බේරිල මට හිනා වෙනවා"



# විහිළුව...

"රොබට් ඔයා ඊයේ කියපු විහිළුවලට අපේ අම්මට මැරෙන්න තරම් හිනා ගියාලු"

"ඇත්තටම? එහෙනං අද කියන්න ඕනෑ ඊටත් වැඩිය හිනහ යන විහිළු දෙක තුනක්"



# නඩුව...

"තමුසෙගෙ දික්කසාද නඩුවට මොකද වුණේ"

"ඒක නේන්නං ඕයි බලනවකො වෙච්ච කරුමෙ. ඒකට ඉඩ දෙන්න බැරිය කිව්වනෙ"

"ඇයි ඕයි නඩුකාරයා සතුටු වෙයියැ තමුසෙට දික්කසාද වෙන්න ඉඩදීල තවත් මිනිස්සු අමාරුවෙ දාන්න"






# දික්කසාදය...

"ආයුබෝවන්ඩ මම පෙරකදෝරු මහත්තයව මුණ ගැහෙන්ඩමයි හිතා හිටියේ. මට දැන ගන්න ඕනෑ කරල තියෙනවා දික්කසාද කරන්න පළමුවෙන්ම කරන්න ඕනෑ මොකක්ද කියල"

"ඒක ඒ හැටි අමාරුවක් නැහැ. දැනට තමුසෙ බැඳල කොච්චර කල් වෙනවද?"

"මම තාම බැඳල නැහැ. ළඟදි බදින්නයි බලාපොරොත්තුව"

# විවාහ ජීවිතය...

විවාහ ජීවිතය කැලඹීම, හැලහැප්පීම් හා පරාජයවීම් ආදියෙන් ගහන වූවකි. විවාහ ජීවිතේ පළමු වසරේදී පිරිමියා කතා කරයි. ගැහැනිය සවන් දෙයි. දෙවන වසරේදී ගැහැනිය කතා කරයි. පිරිමියා සවන් දෙයි. තෙවන වසරේ සිට දෙදෙනාම කතා කිරීමට පටන් ගනී. අසල්වැසියන් සවන් දෙයි.



# නිවැරදිකරු...

"උඹ මේ චෝදනාවට වැරදිකාරයාද? නිවැරදිකාරයාද?"

"මම මුලින් නං හිතා හිටියෙ නිවැරදිකාරයයි කියල. ඒ වුණාට සාක්කි ඇහුවට පස්සෙ මට තේරුම් ගියා මම වැරදිකාරයා බව"



## වෘත්තීය දිවියේ අනේකවිධ කඩ ඉම් පසු කොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය, රැකවරණය ලැබේවායි "රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.



යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි ලෙස

**මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 09 දින සිට**



යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස

**මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 21 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 15 දින සිට**



ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායේ කර්නල් සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල් අයිඑච්එම්එන්එන් හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 24 දින සිට**



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 17 දින සිට**



කාලතුවක්කු හමුදා කර්නල් සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 23 දින සිට**



යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 13 දින සිට**



ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු ලෙස

**මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීසීඑස්බී විජේසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 27 දින සිට**



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 16 දින සිට**



අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා ලෙස

**මේජර් ජෙනරාල් ඩීජී හේවගේ ආර්එස්පී**

**2021 දෙසැම්බර් මස 21 දින සිට**



ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 15 දින සිට**

(මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී 2021.12.08 වන දින ගැමුණු හේවා බලකායේ බලකාධිපති ලෙස ද වැඩ භාරගන්නා ලදී)



61 වන පාබල සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 16 දින සිට**



ඉංජිනේරු සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්කේ ජයවර්ධන ආර්එස්පී**
**යූඑස්පී එන්ඩියූ**

**2021 දෙසැම්බර් මස 22 දින සිට**



56 වන පාබල සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**

**2021 දෙසැම්බර් මස 20 දින සිට**



11 වන පාබල සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී**

**2021 දෙසැම්බර් මස 16 දින සිට**



යුද්ධ හමුදා ආධුනිකයින්
බඳවා ගැනීමේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේපී එදිරිවීර ආර්ඩබ්ලිව්පී**

**2021 දෙසැම්බර් 23 මස දින සිට**



යුද්ධ හමුදා සැලසුම් අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**එස්ජේ කුලතුංග ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 14 දින සිට**



සටන් පුහුණු පාසලේ
සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේඑම්ආර්එන්කේ ජයමාන්න**
**ආර්ඩබ්ලිව්පී**

**2021 දෙසැම්බර් මස 24 දින සිට**



ඉදිරි දර්ශන සැලසුම් හා ක්‍රියාත්මක
කිරීමේ අංශයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**අයිඑච්එම්ආර්කේ**
**හේරත් යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 09 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) බ්‍රිගේඩියර් ප්‍රධාන
මාණ්ඩලික ලෙස

**බ්‍රිගේඩියර්**
**ව්ඩීඑස් පෙරේරා**

**2021 දෙසැම්බර් මස 20 දින සිට**



533 වන පාබල
බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ඒඑම්ජ් අබේවර්ධන ඩබ්ලිව්ඩබ්ලිව්වී**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2021 දෙසැම්බර් මස 21 දින සිට**



573 වන පාබල
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2021 නොවැම්බර් මස 25 දින සිට**



541 වන පාබල
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එම්ඒඩීඑස් මුණසිංහ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී පීඑස්සී අයිජී**

**2021 දෙසැම්බර් මස 17 දින සිට**



ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ
කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**කර්නල්**
**බීඑම්ජ් බාලසූරිය**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 16 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(බටහිර) කර්නල් ප්‍රධාන
මාණ්ඩලික ලෙස

**කර්නල්**
**එම්බීඑල් පෙරේරා ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 14 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම) කර්නල් ප්‍රධාන
මාණ්ඩලික ලෙස

**කර්නල්**
**එම්ජේ උබේසේකර**
**ආර්එස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් මස 20 දින සිට**

# හරවත් වැඩමුළුවක්






මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයෙන් *Military in Internal Security Operation (MISO)* යන මාතෘකා යටතේ වූ වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් 25 සහ 26 යන දෙදින තුළ 1 වන බළකා මූලස්ථානය කිලිනොච්චි හිදී පැවැත්විණ. මේ සඳහා 1 වන බළකාය, 53 වන පාබල සේනාංකය, ඉදිරි නඩත්තු පෙදෙස (කිලිනොච්චිය), කමාන්ඩෝ බලසේනා මූලස්ථානය, විශේෂ බලසේනා මූලස්ථානය සහ ඒ යටතේ පාලනය වන ඒකකවල රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 40 ක් සහභාගී වූහ. වැඩමුළුවේ දේශන ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිතයින් වන විශ්‍රාමික බ්‍රිගේඩියර් ජැක් ලෙමේ (*Jacques Lemay*) සහ එල්සී *L.C* චන්න ජයවර්ධන යන මහත්වරු විසින් සිදු කළහ.

---


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බහි II සේනාරත්න ජීසී
3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ
මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

යුහ දිගුව

51445/51446

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






අධීක්ෂණය

බ්‍රිගේඩියර්
එච්ඩබ්ලිව්ලීපී අමරපාල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
ඊඑච් සුජිත් චමින්ද

# ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපාධි අපේක්ෂක නිලධාරීන් අමතයි







සපුගස්කන්ද, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන "පීඑස්සී" උපාධි අපේක්ෂකයන් ආමන්ත්‍රණය කිරීම යුද්ධ හමුදාධිපති විසින් වාර්ෂිකව සිදු කරනු ලබයි. ඒ අනුව දැනට පැවැත්වෙන එම පාඨමාලා අංක 15 ට අයත් උපාධි අපේක්ෂක නිලධාරීන් ආමන්ත්‍රණය කිරීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් විසින් ඉකුත් දෙසැම්බර් 08 වන දින සිදු කරනු ලැබීය.

"සමකාලීන ආරක්ෂක ක්‍රමවේදය තුළ සන්නද්ධ හමුදාවන්ගේ කාර්යභාරය" (*Role of Armed Forces in the Contemporary Security Landscape*) යන තේමාව ඔස්සේ අදහස් දැක්වූ යුද්ධ හමුදාධිපතිතුමන් වර්තමානයේ පවතින බහුවිධ සහ සංකීර්ණ ආරක්ෂක අභියෝග සඳහා හුදු සෘජු හමුදා බලය භාවිතා කරනවාට වඩා ක්‍රමානුකූලව එකිනෙකට බැඳී ඇති ප්‍රවේශයන් සහ මෙහෙයුම් මාර්ගවල අවශ්‍යතාව පිළිබඳ පෙන්වා දෙන ලදී.




# ගුරු පාරට එන්න

සතුරු වෙසින් පෙරදා නෙක හදවත් ගිනි ගත්තේ
පතුරු වැටුණු ජීවිත යළි දළු ලියලා ඇත්තේ
අතුරු මිතුරු යාළුවො මිස දෙපිලක් මෙහි නැත්තේ
ඉතුරු කරපු රට බලන්න එනවද මේ පැත්තේ

බර අවි හඬ ගිගුම් දුන්න කාලයෙ හරි සැරෙන්
කර ඔසවා ජනෙල් වලින් බැලුවෙත් අපි හොරෙන්
පෙර තිබු සාමය විඳින්න තුරුලට ගෙන වැරෙන්
ඉර පායපු ගුරු පාරට ඇවිද යන්න වරෙන්

ලුතිනන් කර්නල් ඊඒඒ සුජිත් චමින්ද

නත්තලේ අරුත සාමය වුණත් ගෙවුණු යුදමය පරිසරය තුළ සාමය අවැසිම තැන්වල නත්තල තිබුණෙ නැහැ. යුද්දෙ බරපතල කාලෙ සිනා පොදක් නොතිබුණු ඒ ජීවිතවල බිය, සැක සංකා, අවිනිශ්චිත බව විතරමයි තිබුණෙ. කොහොම හරි අපි ඒ අවාසනාවන්ත කාලපරිච්ඡේදය සදහටම නිම කළා. 2009 වසර අග භාගයේදී කිලිනොච්චි "වඩ්ඩකච්චි" ප්‍රදේශයේ අතුරු පාරක ඇවිද ගිය දරුවන් පිරිසකගේ මේ හිනා පිරි ඡායාරූපය කියාපෑවේ අපි උදා කර දුන් නිදහසේ හා සාමයේ සැබෑ අරුතයි.